## 2014 – 06 – 03 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| 01. | ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| 03. | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| 04. | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 05. | පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 07. | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 08. | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 09. | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

**නොපැමිණීම :-**

| | | |
|---|---|---|
| 01. | ජේ. ඩබ්. භාෂිනි මේනුකා විජේසූරිය මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| 02. | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.45 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

**(01)**

**01:01 2014 – 05 – 06 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2014 – 05 – 06 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2014 – 05 – 06 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

3.1 " හල්වතුර ව්‍යාපෘතිය - මු. පි. ගා. 2391 හි කැබලි අංක 03 " මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක 2014- 04- 28 දිනැති ලිපියේ අම්බලන්ගොඩ ශ්‍රී සුනන්දාරාමය ලෙස සඳහන් වී ඇති නමුත් එය පෝරඹ ශ්‍රී සුගතබිම්බාරාමය ලෙස නිවැරදි විය යුතු බවත් සිදුවූ ප්‍රමාද දෝෂය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බවත් ඒ අනුව පෝරඹ ශ්‍රී සුගතබිම්බාරාම විහාරස්ථානයට නැවත ඉඩම නිදහස් කර දීම සම්බන්ධයෙන් ඔබ විසින් ලබා දුන් ලිඛිත එකගතාවය මත ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **හල්වතුර ව්‍යාපෘතිය - මු. පි. ගා. 2391 හි අංක 03 කැබැල්ල පෝරඹ ශ්‍රී සුගත බිම්බාරාම විහාරස්ථානයට පැවරීමට නැවතත් සභාවේ එකගතාවය ලබා දෙන ලදී .**

3.2 " 23 න් පහල ක්‍රිකට් තරග - නගර සභා පිටිය වෙන් කිරීම " මැයෙන් අම්බලන්ගොඩ සිංහ ස්පෝර්ට්ස් ක්ලබ් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත ක්‍රිකට් තරගාවලියේ අප ක්‍රීඩා සමාජය සත්කාරක කණ්ඩායම වශයෙන් කටයුතු කල යුතු තරගයක් 2014- 07- 12 හා 13 දෙදිනට යෙදී ඇති බවත් 2014- 07- 12 දිනයට ඇසළ පොහොය යෙදී ඇති බවත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තරග කාල සටහන අනුව මෙම දින දෙකේම තරගය පැවැත්වීමට සිදුවී ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහිදී මම කියන්න ඕනෙ මීට පෙර නගරයේ විහාරස්ථාන සියල්ලගේම විහාරාධිපතීන් වහන්සේලා අත්සන් කරල ලිපියක් එව්ව පොහොය දිනයන්හිදී ක්‍රිකට් තරග සහ වෙනත් තරග සඳහා ක්‍රීඩාංගණ වෙන් කරන්න එපයි කියලා. මේක ලබා දුන්නොත් ඒ නීතියට පටහැනියි. මේ සම්බන්ධයෙන් සභාවෙ අදහස මොකක්ද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මෙම ක්‍රීඩා සමාජය පිලිගත් ක්‍රීඩා සමාජයක්. මෙය ජාතික මට්ටමේ තරගාවලියක් නිසා අපි එතුමන්ලාට දැනුම් දෙමු අදාල පන්සල්වල ප්‍රධාන නායක ස්ථවිරයන් වහන්සේලාගෙන් අනුමැතියක් ලබා ගන්න කියල.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මේක ලබා දුන්නොත් යම් මත භේදයකට ලක් වෙන්න පුලුවන්. මෙය තරග මාලාවකට අදාල තරගයක්. අපට දැනගන්න ලැබුන විදියට සිංහ ක්‍රීඩා සමාජයට යම් පාඩුවක් ඇති වෙනවා මෙය නොපැවුවහොත්. ඒ නිසා සභාපතිතුමනි කිත්සිරි මන්ත්‍රීතුමා කිව්ව විදියට ගරු ස්වාමීන් වහන්සේලාගේ කැමැත්ත ලබා ගෙන එය සභාවට ඉදිරිපත් කරන්න කියල කියමු.

**<u>තීරණය</u>**

☞ **නගරයේ ඇති විහාරස්ථානවල (කරිත්තකන්ද විහාරය සහ සිරි නිකේතාරාම විහාරය ප්‍රමුඛ ) විහාරාධිපති හිමිවරුන්ගේ අවසරය ලබා දෙන්නේ නම් පමණක් වෙනත් කටයුත්තක් සඳහා පූර්වාදර්ශයක් නොවන පරිදි මෙම ඉල්ලීම සඳහා අවසරය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3.3 " ට්‍රේලර් දෙකක් ලබා ගැනීම සඳහා " මැයෙන් නගර සභාවේ සෞඛ්‍ය පරිපාලක එම්. ඩබ්. එච්. ඒ. විත්‍රාවංශ මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ සෞඛ්‍ය අංශය මගින් සපයන සේවාවන් විධිමත් කිරීම සඳහා අම්බලන්ගොඩ වරාය අසල හා දුම්රියපොල පාරේ රඳවා තැබීම සඳහා ට්‍රේලර් රථ දෙකක් අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සලස්වන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ඇත්තටම මේක අත්‍යාවශ්‍ය කාරණයක්. දැනට තියල තියෙන්නෙ තල්ගස්ගොඩ ප්‍රදේශයේ කුණු අදින ට්‍රේලරයක්. එනිසා ඉතා ඉක්මනින් මෙය ලබා දීල පොදු වෙළඳපොල අසල තියන්න ඕනෙ. පොදු වෙළඳ පොල අසල ඉතාම අශෝභන තත්වෙ තිබුනෙ. දැන් ට්‍රේලරය තිබ්බට පස්සෙ එය යම් තත්වයකට මග හැරිල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, නිලධාරී මහතුනි, මාධ්‍යවේදී මහත්වරුනි, මා කිහිප විටක්ම ඔබතුමාට පෙන්වා දුන්නා පොදු වෙළඳපොල අසල තිබුන කුණු සම්බන්ධයෙන්. මම ස්තුතිවන්ත වෙනවා මෙම ස්ථානයේ ට්‍රේලරයක් තැබීම සම්බන්ධව. මොකද මෙතන කලින් විශාල දුර්ගන්ධයක් තිබුනා. ට්‍රේලර් දෙකක් ඉල්ලීම සම්බන්ධව අපිත් එකගයි. ඒ වෙනුවෙන් අපගේ සහයෝගයත් ලබා දෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අලුතින් ගේනවද? අපි මෙහේ හදනවද? අපි හැදුවොත් ශක්තිය හොඳයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි මෙහේ හැදුවොත් දාන්නෙ ඝනකම තහඩුව. ගෙන්නන ඒවගෙ තහඩුව තුනියි. ගේන එක ඉක්මනින් වුනාට ආයෙ මාස හයකින් විතර නැවතත් ගේන්න වෙනවා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එහෙමනම් අපි බඩු ගේන්නමු. එකක් සති දෙකකින් කරන්න. මේ ඉන්න සේවකයන්ගෙන් ඉක්මනින් කරන්න අමාරුයි කියල හිතෙනව නම් මේ සඳහා පමණක් තව සේවකයන් දෙදෙනෙක් අරගන්න.

තීරණය

☞ **අළුතින් ට්‍රේලර් දෙකක් සඳහා අවශ්‍ය බඩු ලබාදී තාක්ෂණ සේවා උපදෙස් පරිදි කර්මාන්ත අංශය මගින් නිශ්පාදනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**එම කටයුත්ත සඳහා පමණක් අවශ්‍යවේ නම් සේවකයන් දෙදෙනෙකු යෙදවීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

3.4 “ “ 2014-05-20 දින හා 2014-05-22 දින දිනපතා ලංකාදීප පත්‍රයේ පළවූ පාසල් බස් රථ නිසා අම්බලන්ගොඩ ජනතාවට ගෙවල් අතහැරයාමට සිදුව ඇති බව සඳහන් ලිපිය සම්බන්ධවයි ” මැයෙන් අම්බලන්ගොඩ ලංකා පෞද්ගලික පාසල් බස් රථ හිමියන්ගේ සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත කරුණ සම්බන්ධයෙන් තම සංගමය සාමාජිකයන් සමග සාකච්ඡාවක් පැවැත්වූ බවත් ලංකාව පුරා විසිරී සිටින ලක්ෂ 40 ක් වූ පාසල් දරුවන්ගෙන් 60% ක් පමණ පාසල් වලට ගෙන යනු ලබන්නේ තම සේවාව මගින් බවත් රාජ්‍ය අනුග්‍රහයක් නොලැබුනත් තම සේවාව ඉතාම ආරක්ෂාකාරීව ඉටු කරනු ලබන බවත් අම්බලන්ගොඩ ප්‍රදේශයේ පාසල් බස් රථ හා වෑන් රථ 135 ක් පමණ පවතින බවත් ඉන් දරුවන් 9000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවය සපයන බවත් අම්බලන්ගොඩ ජනතාව කිසිම විටෙක අප කරදරයක් බව පවසා නොමැති බවත් අප පාසල් බස් රථ උදේ 6.30- 7.30 කාලය පමණක් නගරයේ පාරවල් පරිහරණය කරනු ලබන අතර නැවත 11.15 - 12.15 හා 1.15 - 1.45 පමණ වන විට නගරයෙන් ඉවත් වන බවත් දිනකට පැය තුනක් පමණ මාර්ගය භාවිතා කරන බවත් අද දින සාකච්ඡාවේදී නගර සභාව අවට වාහන ගාල් කිරීම සිදු නොකරන ලෙස සාමාජිකයන්ට දැනුම් දුන් බවත් නගර සභා පාර 11.15 - 12.15 හා 1.15 - 1.45 වන තෙක් පමණක් දරුවන් ගෙන ඒමට වාහන ගාල් කර තබා ගැනීම සඳහා සහනයක් ලබා දෙන ලෙසත් අම්බලන්ගොඩ නගර සභාව ත්‍රීරෝද රථ, පාසල් රථ, රථ වාහන පොලිසිය ඇතුලුව සියලු පාර්ශවයන් ගෙන්වා රථ වාහන සැලැස්මක් නිර්මාණය කිරීමට යෝජනා කරන බවත් දන්වා තිබුණි.

තීරණය

☞ **මේ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ලංකා පෞද්ගලික පාසල් බස් රථ හිමියන්ගේ සංගමය සහ අම්බලන්ගොඩ පොලිසිය සමග සාකච්ඡාවක් පැවැත්වීමට සභාව තීරණය කරන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා:** **නැත**

**5:2** **නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා** : **නැත**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2014- 05- 27** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මුලාසනය දැරූ 2014/05/27 දින</u>
<u>පුස්තකාල කමිටු වාර්තාව.</u>

- භාරත සමරසේකර මහතා (ලේකම්, නගර සභාව)
- ඩී.වී. වාසනා තරංගී මිය (ප්‍රජා සංවර්ධන නිලධාරි)
- ටී. නදීකා නිල්මිණී මෙනවිය (සංවර්ධන නිලධාරි)
- ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා (කමිටු සාමාජික)
- එච්.එම්. බුද්ධි තාරක මහතා (උපගුරු, කුලරත්න මහා විද්‍යාලය)
- රාජිනි අමරසිංහ මිය (උපගුරු, ගා/දේවානන්ද මහා විද්‍යාලය)
- ජී.එච්.එල්. පියන්ති මෙනවිය (පුස්තකාල සාහායිකා)
- ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා (පුස්තකාල සාහායක)
- ගෞරි වර්සවිතාන මිය (පුස්තකාල සාහායිකා)
- ඒ.ජී. රසිකා මිය (පුස්තකාල සාහායිකා)
- එස්. සුසිලා දීපානි මිය (පුස්තකාල සාහායිකා)
- මාලතී සමන්තා ආරියසිංහ මිය (පුස්තකාල සාහායිකා)
- ඒ.ජී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය (පුස්තකාල සාහායිකා)

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව 2.30ට සභාවේ වැඩ ආරම්භ කළාය.

- **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

පුස්තකාලයාධිපතිනිය අසනීප තත්වය හේතුවෙන් නොපැමිණීම නිසා ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ප්‍රධාන පුස්තකාලයේ සේවය කරන පී.එච්.එල්. පියන්ති මෙනවිය ඉදිරිපත් කරන ලදි.හිරේවත්ත ශාඛාවේ සහ පොල්වත්ත ශාඛාවේ සාහායිකාවන්ට අසනීප බැව් දැන් වු බව ඒ.ඩබ්. ඉන්දදාස මහතා ප්‍රකාශ කළේය. එම නිසා එම ශාඛාවන්හි වාර්තාව එම මහතා විසින් ඉදිරිපත් කරන ලදි. අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ද, විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව සංවර්ධන නිලධාරි ටී. නදීකා නිල්මිණි මෙනවිය විසින් ද ඉදිරිපත් කරන ලදි.

පරිත්‍යාග කරන ලද පොත් සඳහා විල්සන් වික්‍රමසිංහ මහතාටද, අශෝක කුමාර මහතාටද, ගරු සභාපතිතුමා නගර සභාව වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කළේය. මේ අවස්ථාවේ පාඨක අදහස් පොත් බැලීමෙන් පසු පාඨකයින් ඉල්ලා ඇති පොත් සියල්ලම ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය දැනුවත් කළේය.

- කෙරමිණිය ශාඛා පුස්තකාලයේ පාඨකයින් ඉල්ලා ඇති විෂය සම්බන්ධ පොත් සඳහා කොපමණ මුදලක් අවශ්‍ය දැයි එම සාහායිකාවගෙන් විමසුහ. එහිදි එතුමිය රු. 10,000/- (දහදාහක් පමණ) අවශ්‍ය බැව් පැවසුවාය. එම මුදල සමග අනෙක් ශාඛාවලත් ඉල්ලා ඇති පොත් ලබාදීමට රු.50,000/- මුදලක් ලබාගෙන එම පොත් එම ශාඛාවලට ලැබීමට සලස්වන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය දැනුවත් කළේය. ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ඉසුරුපායේ අධ්‍යාපන ප්‍රකාශන පොත්හලින් සහනදායි මුදලකට මිලදිගත හැකි බැව් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

- පුස්තකාලයේ පොත්පත් හා සියලු දේ සූචිගත කොට නවීන තාක්ෂණය අනුව පරිගණකගත කිරීම සුදුසු බැව් කමිටු සාමාජික පීනේන්ද්‍රවංශ මහතා පෙන්වා දෙන ලදි.

- සෙනසුරාද පුවත්පත් ප්‍රමාද වී 10.30ට පමණ ලැබෙන බැව් ඕකන්ද ශාඛා පුස්තකාලයේ පාඨක අදහස් පොතේ සඳහන් විය. එය නිරීක්ෂණය කිරීමෙන් පසු ගරු සභාපතිතුමා එයට පිළියමක් ලෙස ප්‍රධාන පුස්තකාලයට එම පුවත්පත් ලබාගැනීම සුදුසු බැව් පෙන්වා දෙන ලදි. එම සාහායිකාවට එම පුවත්පත් සෙනසුරාදා දිනට ප්‍රධාන පුස්තකාලයෙන් රැගෙන යන ලෙස පැවසීය.

- විද්‍යුත් පුස්තකාලයේ අදහස් ලේඛනයේ සඳහන් පරිදි අවශ්‍ය සංයුක්ත තැටි ඉහත සඳහන් වු රු.50,000/- ක මුදලින් ලබාගෙන එම පාඨකයින්ගේ අවශ්‍යතාවය සපුරන ලෙස ඉල්ලීමක් කළේය. මාසයකට විද්‍යුත් පුස්තකාලයේ සාමාජික මුදල රු.100/- වැඩිබව පාඨක අදහස් පොතේ සඳහන් කර ඇති බැවින් එයට පිළියමක් ලෙස එම මුදල සමෘද්ධි ලබන පවුල්වල ළමයිනට රු.25/- ක් වන සේ අය කරන ලෙස සභාපතිතුමාගේ ද කමිටු සාමාජිකයන්ගේද අදහස විය. ඒ සඳහා සමෘද්ධි ලාභියෙක් බව ඔප්පු කිරීමට ප්‍රාදේශිය ලේකම් මහතාගේ නිර්දේශයක් අවශ්‍ය බවද සම්මත විය.

- ජාතික කියවීම් මාසයේ තරග හා උත්සවය ගැන ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගෙන් කරුණු විමසන ලදි. එම තරගවල ත්‍යාග හා සහතිකපත් ඇස්තමේන්තු මුදල ගැන විස්තරයක් ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය කමිටුවට ඉදිරිපත් කළේය. ගිය වසරේ පැවැත් වු තරග මේ වසරේත් පැවැත්වීම සුදුසු බවද කමිටුවේ තීරණය විය. තරග විනිශ්චය සඳහා කලාප අධ්‍යක්ෂකතුමා දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා පැවසීය.

- අම්බලන්ගොඩ පාසල්වලට එම තරඟ සඳහා අයදුම්පත් හා විස්තර විදුහල්පති මඟින් දැන්වුවද සමහර සිසුන්ට එය නොලැබෙන බැව් පෙන්වා දෙන ලදි. එයට පිළියමක් ලෙස ක්‍රීඩා උත්සවය වෙනුවෙන් තරඟ හා ඒ පිළිබඳ විස්තර ඇතුලත් කර සකස් කරන ලද ආකාරයේ පොතක් සෑදීම සුදුසු බව ගරු සභාපතිතුමා පෙන්වා දෙන ලදි. එමෙන්ම පාසල්වලට අයදුම්පත් හා විස්තර පත්‍රිකා යැවීමේදී විෂයයන් භාර ගුරු මහත්ම මහත්මීන්ට වෙන වෙනම ලැබෙන පරිදි යැවීමෙන් සෑම දෙනාටම අසාධාරණයක් සිදු නොවන බවත් සභාපතිතුමා පැවසීය.

- මේ අවස්ථාවේ විද්‍යුත් පුස්තකාලය සඳහා සංයුක්ත තැටියක් (CORE මාසික අධ්‍යාපනික සංයුක්ත තැටිය) ජිනේන්ද්‍රවංශ මහතා විසින් පරිත්‍යාග කරන ලදි. එයට ගරු සභාපතිතුමා ඇතුළු සෑම දේනාගේම ස්තුතිය පුද කරන ලදි. ඕකන්ද ශාඛා භාර සාහායිකාව කියා සිටියේ පාඨක අදහස් පොතේ සඳහන් පොත්වලින් කීපයක් පමණක් ඇයට ලැබුණු බවයි. එම අඩු පොත් ද එම පුස්තකාලයට ලැබීමට සලස්වන ලෙස ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරි තුමියට පැවසීය.

- වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ස්තුති කතාව සඳහා ගරු සභාපතිතුමා විසින් ලේකම් මහතාට ආරාධනා කළේය. එහිදී එතුමා ස්වේඡාවෙන් කමිටුවට පැමිණි සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

**ඒ අනුව 2014 -05- 27 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>කමිටු වාර්තාව සම්බන්ධයෙන් ගත් තීරණ</u>**

- **විද්‍යුත් පුස්තකාලය සඳහා රු. 50000/- ක් වටිනා සංයුක්ත තැටි මිලදී ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**
- **සමෘද්ධිලාභී පවුල්වල ළමුන් සඳහා විද්‍යුත් පුස්තකාලය භාවිතා කිරීමේ මාසික ගාස්තුව රු. 100/- සිට රු. 25/- දක්වා අඩු කිරීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014- 05- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**
**2014.05.19 ප.ව. 2.30**

**සහභාගීත්වය**

| | |
|---|---|
| ❖ ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ එච්.එල් අනුර කිත්සිරි මහතා. | ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ එස්.ඩබ්. භාෂිණී විජේසූරිය මිය. | ගරු නගර සභා මන්ත්‍රිනී, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ එල්.එච්.බී මංජුල මහතා. | ම. සෞ. පරීක්ෂක බරවා මර්දන ඒකකය. |
| ❖ ඩබ්.එන්.අයි මෙන්ඩිස් මහතා. | ම. සෞ. පරීක්ෂක අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ කේ.ජී.පී ප්‍රියදර්ශන මහතා. | ස්ථානාධිපති (රථවාහන) පොලිස් ස්ථානය අම්බලන්ගොඩ. |
| ❖ එච්.නයනා චාන්දනී.මිය | ප්‍රා. ලේ.කාර්යාලය, අම්බලන්ගොඩ. |
| ❖ පී.එච් කුමාර ද සිල්වා මහතා | ග්‍රාම නිලධාරී කලුවඩුමුල්ල, කෙරම්ණිය. |
| ❖ එම් මලිත් ප්‍රනාන්දු මහතා. | තාක්ෂණ සේවා නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී. සී සජීවනී මිය. | තාක්ෂණ සේවා නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩී. වාසනා තරංගි මහත්මිය. | ප්‍රජා සංවර්ධන නිලධාරී. අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ බි.ඩී.ඊ කොඩිතුවක්කු මහත්මිය | ප.සෞ..සේ නිලධාරී අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී. එච්. එල්. සී. පුෂ්පරාණි මහත්මිය. | සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ පී. කුසුම් ද සිල්වා මහත්මිය. | කළමණාකරණ සහකාර |
| ❖ ටී බන්දුසීල මහතා | සෞඛ්‍ය පරිපාලක |

**පිළිගැනීම.**

**ගරු නගර සභා මන්ත්‍රිනී එස්.ඩබ්. භාෂිණී විජේසූරිය මිය.**
සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් ඇතුලු සියළු නිලධාරී මහත්ම මහත්මීන් හා ස්ථානාධිපති (රථවාහන) ප්‍රියදර්ශන මහතාත්, අනෙකුත් සියළුම රජයේ නිලධාරිනුත්, නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි.

**2014.04.29 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය**

| | මාතෘකාව | **සාකච්ඡා වූ කරුණු** | **ප්‍රකාශය කවුරුන් විසින්ද යන වග** | **තීරණය** |
|---|---|---|---|---|
| | පුස්තකාලයට යාබද ආපන ශාලාවෙන් පිටවන අපද්‍රව්‍ය සම්බන්ධ ගැටළුව | අපද්‍රව්‍ය උරා ගැනීමේ වල සකස් කිරීම මේ වන විට සිදුවෙමින් පවතින බව | තාක්ෂණ සේවා නිලධාරී මලිත් ප්‍රනාන්දු මහතා | |
| | කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය පස් දමා සකස් කිරීම | මෙම මාර්ගය සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇති බව. නිවාස කඩා ඉවත් කරන ද්‍රව්‍ය ටිපර් රථයට පැටවීමට සේවකයන් යොදා ගැනීම එතරම් සාර්ථක නොවන බව | ම.සෞ.ප.පී.එස්. එස්. ද සිල්වා මහතා | |

| | | | | |
|---|---|---|---|---|
| | | මාර්ගය පිරවීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි අබලි ද්‍රව්‍ය නොමිලේ ලැබෙන බැවින් ඒවා පැටවීමට අවශ්‍ය JCB යන්ත්‍රය කුලියට ලබා ගැනීම සුදුසු බව | ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා | |
| | කාර්ය මණ්ඩල සඳහා සෞඛ්‍ය සායනයක් පැවැත්වීම | සායනය සඳහා දින ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්, දන්ත රසායනාගාර බස්රථය හා ජංගම රසායනාගාර බස්රථය නිදහස් කළ හැකි දිනක සායනය පැවැත්වීම සඳහා දිනයක් ලබා දිය හැකි බව සෞ.වෛ.නි. සංජීව මහතා පැවසූ බව | ම.සෞ.ප.පී.එස්. එස්. ද සිල්වා මහතා | |
| | THW නිවාස යොජනා ක්‍රමයේ වැසිකිළිවල හිස් කිරීම. | මෙම වැසිකිළි වලවල් හිස් කිරීම මෙවර පමණක් සිදු කරන ලෙස සභාතීරණයක් ලැබුණු බවත්, මෙය ක්‍රියාත්මක කිරීමට නම් හික්කඩුව ජල සම්පාදන මණ්ඩලය වෙත බැදිය යුතු එක් ලෝඩ් එකක් සඳහා රු 1008 බැගින් වන ලෝඩ් 4ක මුදල ගෙවීමට අයකු නොමැති බව | ම.සෞ.ප.පී.එස්. එස්. ද සිල්වා මහතා | ලෝඩ් එකකට රු. 1008 බැගින් වන මුදල නිවෙස් අයිති කරුවන් ගෙන් අයකර එම කාර්ය ඉටු කිරීම |
| | | මෙම ගැටළුව පසුගියදා පැවති සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළ ද කාළය ප්‍රමාණවත් නොවීම නිසා සාකච්ඡාවට භාජනය නොවූ අතර දිස්ත්‍රික් සම්බන්ධීතරණ කමිටුවට ඉදිරිපත් කිරිමට නියමිත බව | නයනා චාන්දනී මිය | |
| | වෙනත් කරුණු | | | |
| | පටබැඳිමුල්ල 439/09 නිවස අසල මාර්ගයේ නිවෙස් 4ක කසල ලබා නොගත් බව | පටබැඳිමුල්ල 439/09 නිවස අසල මාර්ගයේ නිවෙස් 4ක කසල ලබා නොගත් බව | ගරු නගර සභා මන්ත්‍රීනී භාෂිණී විජේසූරිය මිය. | |
| | | මේ පිළිබඳව පරීක්ෂා කර එම නිවෙස් 4හි කසල ගැනීමට කටයුතු කරන බව | ම.සෞ.ප. | |
| | තුඩුවමුල්ල පටුමග කාණු පද්ධතිය පිරිසිදු කිරීම | තුඩුවමුල්ල පටුමග කාණු පද්ධතිය පිරිසිදු කිරීම | ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා . | |
| | | මේ සඳහා ඉදිරි දින වලදී කම්කරුවන් යොදවන බව | ම.සෞ.ප. | |
| | කලුවඩුමුල්ල මාර්ගය හරහා අපද්‍රියර ගලා යාම. | කලුවඩුමුල්ල මාර්ගය හරහා අපද්‍රියර ගලා යාම. | ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා . | |
| | | නිවෙස් හිමියා දැනුවත් කළ බවත්, සති 2ක් තුළ අපද්‍රියර උරා ගැනීමේ වල සකස් කරන බවත් පවසන ලදි. | ම.සෞ.ප.පී.එස්. එස්. ද සිල්වා මහතා | |
| | පරණ සිංගර් එක අසල කසල දැමීම | පරණ සිංගර් එක අසල කසල දැමීම සිදුවන බවත්, පොලිසියේ සහාය ඇතිව මේ තත්වය පාලනය කළ හැකි බව. | ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා . | |
| | බස් නැවතුම්පල පොදු වැසිකිළියේ | බස් නැවතුම්පල පොදු වැසිකිළියේ ජලනල අවහිර වීම. | ම.සෞ.ප.පී.එස්. එස්. ද සිල්වා | ඇස්තමේන්තුවක් සකස් කර සභාවට |

| | | | | |
|---|---|---|---|---|
| | ජලනල අවහිර වීම. | | මහතා | ඉදිරිපත් කර අවශ්‍ය ද්‍රව්‍ය ගබඩාව වෙත ගෙන්වා ගෙන එම කාර්ය ඉටු කරන ලෙස |
| | | තමා ම.සෞ.ප.සමග ගොස් පරික්ෂා කළ බවත් ජලනල සම්පූර්ණයෙන්ම ගලවා නැවත සවි කළ යුතු බවත්, | තාක්ෂණ සේවා නිලධාරී මලිත් ප්‍රනාන්දු මහතා. | |
| | දේවානන්ද විද්‍යාලයේ ගලි ලෝඩ් 3ක් එකවර අදින ලෙස විදුහල්පතිතු පවසන බව. | දේවානන්ද විද්‍යාලයේ ගලි ලෝඩ් 3ක් සඳහා අයදුම්පත් භාරදී ඇති අතර එකවර සියල්ල අදින ලෙස විදුහල්පතිතුමා පැවසුවද දිනකට ඇදියහැක්කේ එක් ලෝඩ් එකක් පමණක් බවත් හෙට දින කසල ලෝඩ් 2ක් ඇදීමෙන් අනතුරුව සේවකයන් ගලියට යෙදවීමට අනුමැතිය ලබා දෙන ලෙස | ම.සෞ.ප.පී.එස්. එස් ද සිල්වා මහතා | සභාපතිතුමාගේ උපදෙස් අනුව කටයුතු කරන ලෙස |
| | කෙරම්ණිය පින්නදූව තල්ගස්ගොඩ යන ට්‍රැක්ටරය කැඩී ඇති බව | කෙරම්ණිය පින්නදූව. තල්ගස්ගොඩ යන ට්‍රැක්ටරය කැඩී ඇති බව | | |
| | | මෙය අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින් ගබඩාව හරහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගෙන ඉතා කඩිනමින් එම කාර්ය ඉටු කරන්න | ගරු නගර සභා මන්ත්‍රී එච්. එල් අනුර කිත්සිරි මහතා | |
| | ම.සෞ.ප වැඩ බැලීමේ වැටුප | මාස 10ක් වැඩ කළ ද මේ වන තුරු වැඩ බැලීමේ වැටුපක් ලැබී නොමැති බවත්, පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම්ගෙන් පත්වීම් ලිපියක් ලබා ගත යුතු බවත් ලේකම් මහතා පැවසූ බව | ම.සෞ.ප.පී.එස්. එස්. ද සිල්වා මහතා | |
| | | ම.සෞ.ප. මහතාගේ වැඩ බැලීමේ වැටුප ගෙවීම සියළු මන්ත්‍රීවරුන්ගේ එකගත්වයෙන් සභාව අනුමත කර තිබුණ ද විධිමත් වැඩ බැලීමේ පත්වීම් ලිපියක් ලැබෙන තුරු එය ක්‍රියාත්මක කළ නොහැකි බව ලේකම් මහතා පැවසූ බව | නගර සභ මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කර ඉක්මණින් වැඩ බලන දීමනාව ලබා දිමට කටයුතු කරන ලෙස ලේකම් මහතාට පවරන ලදි. |
| | නගරයේ එකතුවන කසල දැමීම සඳහා ස්ථාන කිහිපයක ට්‍රේලර තැබීම | නගරයේ එකතුවන කසල දැමීම සඳහා ස්ථාන කිහිපයක ට්‍රේලර තැබීම තුළින් කසල බැහැර කිරීම පහසු බව. | නගර සභ මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | මෙම යෝජනාව සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම |
| | නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීමේදී ස්ලැබ් කැලි කැඩීම නිසා වෙළඳ සැල් හිමියන් කම්කරුවන්ට පහර දීම | නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීම සිදු කරන අවස්ථාවේ වෙළඳ සැල් ඉදිරිපිට කොන්ක්‍රීට් ලෑලි කැඩීම නිසා වෙළඳ සැල් හිමියන් කම්කරුවන්ට බැණ වැදීම් සිදු කරන බව | ම.සෞ.ප.පී.එස්. එස් ද සිල්වා මහතා | |
| | | කාණු පිරිසිදු කිරීමේ දී නගර සභා ආඥාපනත මගින් ලැබී ඇති බලතල පිළිබඳ විස්තර සහිතව කඩ හිමියන් වෙත දැනුවත් කිරීමේ ලිපියක් යවා කම්කරුවන්ට කිසිදු අයුරකින් කරදර | නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | |

| | | | | |
|---|---|---|---|---|
| | | නොකරන ලෙස | | |
| | සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා රේන් කෝට් ලබා දීම | සෞඛ්‍ය කම්කරුවන් සඳහා භාග රේන් කෝට් සහ රියදුරන් සඳහා සම්පූර්ණ රේන් කෝට් ලබා දෙන ලෙස ඉල්ලීම කළ ද මෙතෙක් ඒවා නොලැබුණු බව | ම.සෞ.ප. පී.එස්.එස්. ද සිල්වා මහතා | මෙම යෝජනාව සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම |
| | පුංචි පොල නිසා ඒ අවට ප්‍රදේශය දැඩි සේ අපිරිසිදු වීම | පුංචි පොල තුලින් ඉවතලන ද්‍රව්‍ය නිසා එම ප්‍රදේශය බොහෝ සෙයින් අපිරිසිදුවීමත් දුර්ගන්ධය හමන බව | ගරු නගර සභා මන්ත්‍රී එච්.එල් අනුර කිත්සිරි මහතා | මේ සම්බන්ධව සභාවේ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදි. |
| | ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පළාත් පාලන සතියේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක දිනය වෙනුවෙන් පාසල් හා ගම් මට්ටමේ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | නගර සභා මන්ත්‍රී පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | |
| | ස්තුති කතාව | අද දින රැස්වීම සඳහා පැමිණි සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී. | නගර සභා මන්ත්‍රී පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | |
| | නිමාව ප.ව.04.30 | | | |

සකස් කළේ :
පී.එච්.එල්.සී.පුෂ්පරාණි.
සංවර්ධන සහකාර (පරිසර)

**ඒ අනුව 2014 -05- 19 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>කමිටු වාර්තාව සම්බන්ධයෙන් ගත් තීරණ</u>**

- **සෞඛ්‍ය අංශයේ සියලු සේවකයන් සඳහා වැහි කබා ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පුංචි පොළේ එකතු වන කුණු කසල සම්බන්ධයෙන් මෙම සභා වාරයේදී සාකච්ඡා කිරීමට තීරණය කරල තියෙනවා. මම හිටියෙ නැහැ මේ කමිටුවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි දැනට මේ පුංචි පොළ නිල නොවන ආකාරයෙන් විවිධ සේවා සමුපකාර සමිතියෙන් පවත්වාගෙන යනවා. මේක ස්වයංරැකියා මධ්‍යස්ථානයක් හැටියට පැවසුවත් මෙය පුංචි පොලම තමයි. මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණ වන්නේ විවිධ සේවා සමුපකාර සමිතියත් අම්බලන්ගොඩ නගර සභාවත් රාජ්‍ය ආයතන වශයෙන් ගත්තහම අපට තියෙන ආර්ථික වටිනාකම් පුංචි පොල නිසා ඇහිරිලා තියෙනවා. අපේ හිටපු නාගරික මන්ත්‍රීවරයෙක් වගේම උප සභාපති වරයෙක් ලෙස කටයුතු කරපු සහෝදර මන්ත්‍රීවරයෙක් තමයි දැන් සමුපකාර සභාපතිත්වය දරන්නෙ. එතුමා මේ ස්ථානයේ ඉඳගෙනත් දැරුවෙ මෙම පුංචි පොල ආර්ථිකමය වටිනාකමක් තියෙන ස්ථානයක් හැටියට මෙහි රථගාලක් නිර්මාණය කරමු කියන මතය. දැන් ලංකා බැංකුව පවත්වාගෙන ගියපු පරිශ්‍රය තුල පුංචි පොල පවත්වාගෙන යනවා. මෙම ස්ථානය

එතුමාලට වෙනත් කටයුත්තකට යොදා ගෙන ආදායමක් ගන්න පුලුවන්. එතුමන්ලාට රු. 6000/- ක දෛනික ආදායම ගන්න අදහස පටු විදියට හිතුවහම ඒකම දිගින් දිගටම පවත්වාගෙන ඔවුන්ගෙ අදහස නම් අපි විද්වත් මණ්ඩලයක් සමග සාකච්ඡාවක් පවත්වල එතුමන්ලාට අවශ්‍ය කරුණු ගොනු කරල දෙමු සභාපතිතුමනි. ඔතන තියෙන ඉඩ ප්‍රමාණයම තමයි ගාල්ල සමුපකාර රෝහල් පරිශ්‍රයට තියෙන්නෙ. මෙම ස්ථානය අම්බලන්ගොඩ නගරයේ දැවැන්ත ආර්ථිකමය මර්මස්ථානයක් ලෙස සලකන්න පුලුවන් ස්ථානයක්. ඒ තත්වයක් තුල අවම වශයෙන් ඉදිරියේදි කටයුතු කිරීමටවත් මොකද ඔතන නැවතත් පොලක් ඇටෙව්වොත් එය තව අවුරුදු ගානකට අම්බලන්ගොඩ නගරයේ සංවර්ධනය කොටු කිරීමක් වෙනවා. අපි රටේ ලෝකය දිහා ඇහැ ඇරල බලන්න ඕනෙ. වැල්ලවත්ත පොල තිබුනෙ පුංචි බිම් කඩක. අද එම ස්ථානයේ අපූරු වෙළඳ පොලක් නිර්මාණය වෙලා මැනින් පෙදෙස කියල නම් කරල තට්ටු අටක රථ ගාලක් නිර්මාණය කරල තියෙනවා. අපි සමුපකාර සමිතියට කාරුණිකව පෙන්නුම් කරන්නෙ අම්බලන්ගොඩ සංවර්ධනය වෙනුවෙන් තියෙන අයිතියක් සහ වගකීමක් හැටියටයි. මම හිතන ආකාරයට පොලක් පවත්වාගෙන යාමේ නෛතික අයිතිය තියෙන්නෙ පළාත් පාලන ආයතනයන්ට. අපිත් එක්ක එකට වැඩ කරන වෙළඳ සංගමයෙ අදහස තිබුනෙ පොදු වෙළඳ පොල ආශ්‍රිතව හෝ ධීවර වරාය ආශ්‍රිතව පුංචි පොල නැවත ස්ථාපනය කිරීමට කියන දේ තමයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය කියන සියලු කරුණු අපේ හිටපු මන්ත්‍රීතුමා දන්නවනෙ. එතුමාත් එක්ක සාකච්ඡා කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එතුමාගේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන්න කියල අපි පුද්ගලිකව දිගින් දිගට ඉල්ලීම් කරා. පරිපාලනමය වශයෙන් එතුමාට එතන තියෙන භූමිකාව අනුව තීරණ ගන්න සිද්ධ වෙනවද දන්නෙත් නැහැ. එනිසා අපි ඉතා ඉක්මනින් මොකද නැවත එතන ඩෝසර් කරල තියෙනව ගල් වැලි ගෙනිල්ල බාල තියෙනව නැවත ඉදිකිරීමේ කටයුත්තකට මුල පුරනවා.

- **පෙ. ව. 10.20 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉදිකිරීම සම්බන්ධව අනුමැතියක් අරගෙනද තියෙන්නෙ. අනුමැතිය අරගෙන නම් අපි අධ්‍යක්ෂ මණ්ඩලයත් සමග සාකච්ඡාවක් ඉල්ලමු. ඇත්තටම එතන තට්ටු දහයක ගොඩනැගිල්ලක් ගැහුවත් කමක් නැහැ. පොඩි පොඩි සිල්ලර වැඩ වලට ගන්නෙ නැතුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි පොඩි පොලේ ඉන්න අයගෙ දුක ඔය තරමට දැනෙනව නම් අම්බලන්ගොඩ ජනතාවගෙ තියෙන විපත්කාරී තත්වය පෙන්නුම් වෙන්න ඕනෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ ගැන සාකච්ඡා කරමු. ඒගොල්ලොත් ස්වාධීන ආයතනයක්. අපි ඒගොල්ලන් එක්ක යම් එකගතාවයකට පත් වෙන්න ඕනෙ. අපිම තමයි පන්සල පාරෙ තිබුන පොල ගෙනිහිල්ල සමුපකාරයට දැම්මෙ. අපි ඒ වෙලාවෙ මාර්ග තදබදයට පිලියමක් විදියට තමයි ඒක කරේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි කියන්නෙ ඒක ඉවත් කරන්න කියල නෙමෙයි. අපිට වෙරළ තීරයේ යම් ඉඩකඩක් තියෙනව පොලක් නිර්මාණය කරන්න පුලුවන් මට්ටමේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ ඉඩම් වල අයිති කරුවන් ඉන්නව. නගර සභාවට අයිති කොටසුත් තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

සභාපතිතුමනි මම ඉල්ලා සිටිනවා මේ පුංචි පොල සම්බන්ධයෙන් ඉතා ඉක්මනින් සුහදව සාකච්ඡා කරල හොඳ තීරණයක් අරගන්න කටයුතු කරමු කියලා. මොකද අශ්වයා ගියාට පස්සෙ ස්ථාලය වහල වැඩක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි අපි පත්වෙලා ආව මුල්ම සභාවෙදිත් මේ පුංචි පොල ගැන කතා කරා. එදා ඉදල දිගින් දිගටම කතා කරපු මාතෘකාවක් තමයි මේක. මම කිත්සිරි මන්ත්‍රීතුමාගෙ අදහස් සමග එකග වෙනවා. මෙතනින් පත්වෙලා ගියපු අපේ සහෝදර මන්ත්‍රීතුමාත් හිටියෙ ඒ මතේමයි. එතුමාත් එක්ක සාකච්ඡා කරපු වෙලාවෙ කිව්වෙ සභාපතිතුමත් එක්ක කතා කරල තීරණයක් ගනිමු කියලා. ඔබතුමන්ල අතර සම්බන්ධීකරණය නැති නිසාද දන්නෙ නැහැ මේ දේවල් සිදු නොවෙන්නෙ. මෙතන නම වෙනස් කරල ආර්ථික මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපනය කරන්න යනවනම් මේ නගරයේ පාලන අධිකාරියේ බලය තිබිය යුත්තේ නගර සභාවට විනා අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියට නෙමෙයි. පොලක් පවත්වාගෙන යාමේ බලය නගර සභාවට තියෙන්නෙ. අපි තීරණ ගන්නෙ නගරයේ ජනතාව වෙනුවෙන්. ඒ තීරණ නිසා ඔවුන්ගේ ආර්ථිකයට යම් පහරක් වදිනව නම් වගකීම අපිට එනවා. මහා විදියේ වෙළඳ ප්‍රජාව මේ වන විට වෙළදාමෙන් අඩපණ වෙලා තියෙන්නෙ. සමුපකාරෙන් මෙහා පැත්තට කඩ වැසියන තත්වයක් තියෙන්නෙ. අම්බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය නංවන්න පලුවන්නම් ඒක ලොකු දෙයක් වෙනවා. එම නිසා අදාල පාර්ශයවන් සමග සාකච්ඡාවක් ඉක්මනින්ම කැදවන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි සමුපකාර සමිතියේ ගරු සභාපති තුමා නගරසභා මන්ත්‍රීවරයෙක්ව සිටි කාලයේ එතුමාගේ දැඩි වුවමනාව තිබුනෙ මේ පුංචි පොල අයින් කිරීමයි. මේ පුංචි පොල පැවැත්වීම සම්බන්ධව අපි කිසිම විරෝධතාවක් නැහැ. මේකෙන් වෙළඳ ප්‍රජාවට වන හිරිහැරය තමයි සභාපතිතුමනි තියෙන ගැටලුව. මෙතන ඉතාම අශෝභනයි. හැමදාම එක පමණ වෙනකොට කුණු ගොඩවල් ගහනව. අපි ඒව අයින් කරන්න ඕනෙ. සමුපකාර සමිතියට ආදායම ලැබෙනව වගේම අම්බලන්ගොඩ නගරයේ අයබදු ගෙවන ජනතාවගේ මුදලින් තමයි මේ කුණු ටික ඇදෙන්නෙ. මේක අපිට ලොකු බරක්. ඒ නිසයි අපි කියන්නෙ මේක මෙතනින් ඉවත් කරන්න. ඉවත් කරල කිත්සිරි මන්ත්‍රීතුමා කියපු ස්ථානයට ගෙනිච්චොත් අපට තියෙන විශාල ගැටලුවක් විසදෙනව. ඒ තමයි අපේ පොදු වෙළඳපොල. මේ වෙනකොට එළවලු මාර්කට් එක සම්පූර්ණයෙන් වැහිල තියෙන්නෙ.  අද එළවලු මාර්කට් එකේ හතර පස් දෙනෙක්ට වඩා එළවලු විකුණන්නේ නැහැ. මට ආරංචි විදියට නැවත වරක් මෙම පුංචි පොළ පරණ ස්ථානයට අරගෙන යන්න හදන්නෙ. ඒ නිසා මේ සම්බන්ධයෙන් සමුපකාර සභාපතිතුමා එක්ක සාකච්ඡා කරල ඉක්මනින් තීරණයක් ගන්න කියල ඉල්ලා සිටිනවා.  ඒවගේම අපේ හිටපු ගරු මන්ත්‍රීතුමා රාහුල ලලිතවික්‍රම මහතා මේ සභාව නියෝජනය කරද්දී තමයි මේ ස්වයංරැකියා මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් යෝජනාව ආවෙ. ඒ අවස්ථාවෙ එතුමා මේකට දැඩිසේ විරුද්ධව කරුණු ඉදිරිපත් කල බවත් එතුමාට දන්වා යවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි අපි මේ පුංචිපොල සම්බන්ධව කතා කිරීම ඉතා ඈතක ඉදන් කෙරෙනවා. දැනට අවුරුදු 10 ක පමණ කාලයක් තිස්සේ මේ ගැන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් අපිත් කතා කරා මිසක් කිසිම තීන්දුවකට ඇවිල්ල නැහැ. අම්බලන්ගොඩ පොදු වෙළඳපොල මේ වන විට 99% ක් ම වැහිල. මම එක්සත් ජාතික පක්ෂ නගර සභා පාලන කාලෙ උප සභාපතිව ඉන්න කාලෙ මම ඔය පොල මාර්කට් එකට අරගෙන ගියා. ඒ පොල සඳහා එලවලු කඩ වලට අමතරව කඩ 55

ක අවශ්‍යතාවයක් තිබුණා. ඒ කඩ 55 තාවකාලිකව ඉදි කරල අවශ්‍ය වුනොත් හිස්ව තිබුන මාලු තොග කොටසෙත් කඩ ගහල දෙන්න තමයි සූදානම තිබුනෙ. නමුත් අක්‍රමවත් වැඩ පිළිවෙල නිසා මෙය අසාර්ථක වුනා. නැවත සමුපකාරය විසින් මෙම ස්ථානයේ පොල පටන් ගත්තා. මෙතනදි අපි නගර සභාව වශයෙන් යම් ස්ථාවරයක ඉන්න ඕනෙ. අපි මේ පොල මෙතනින් අයින් කරනවද නැද්ද යන්න අපි තීරණය කරන්න ඕනෙ. ඉතිහාසය පුරාවට ආපු පොදු වෙළඳ පොල ඔය ආකාරයෙන් තියෙනවද? නැත්නම් මොනවද කරන්නෙ. මේක නැවත පටන් ගන්නවද කියන තීරණය මේ නගර සභාව ගන්න ඕනෙ. අවුරුදු දොලහක් විතර මේ මාර්කට් එක වහපු නිසා නගර සභාවට විශාල ආදායමක් අහිමි කරගෙන තියෙන්නෙ. දැන් මෙතනදි නගරයේ හදවතට ගෙනල්ල තියෙන්නෙ පොල. මම හිතන්නෙ ලංකාවෙ නෙමෙයි ලෝකෙ කොහේවත් නැතුව ඇති එහෙම දෙයක්. අපි මන්ත්‍රීවරු සියලු දෙනාගේම මතය වෙන්නෙ මෙම ස්ථානයේ අංග සම්පූර්ණ සාප්පු සංකීර්ණයක් ඉදි වීම. අපි හැමෝම මේ ස්ථාවරයෙ ඉන්න ගමන් අපි අනුබල දෙනව පොල පවත්වාගෙන යන්න. කුණු ටික අදිනව. බලපත්‍ර නැතිව පොල පවත්වගෙන යන්න දෙනවා. ස්ථිර ගොඩනැගිලි ඉදිකරන්න අවසර දෙනවා. අපිට සමුපකාර අධ්‍යක්ෂක මණ්ඩලය සමග සාකච්ඡා කරල වැඩක් නැහැ. දැන් අවුරුදු දොළහක් තිස්සෙ කතා කරානෙ. මම විරුද්ධයි ඔවුන් සමග සාකච්ඡා කරනවට. අපිට බලය තියෙනවා. අපි තීන්දුවක් ගන්න ඕනෙ මේක කරනවද නැද්ද කියලා. ඒවගේම අපි මේ ටවුන් එකේ මැද විශාල වාහන තදබදයක් නිර්මාණය කරල තියෙනවා. අද වෙනකොට බලන්න දුම්රිය පොල පාර මිනිස්සු ගැවසෙන්නෙ හරිම අඩුවෙන්. ඉස්සර කාලෙ විශාල පිරිසක් ගමන් කරපු පාරක්. අද මහා විදියේ කඩ ස්ටෝරු බවට පත් වෙලා. අපි මේකට තීරණයක් ගන්න ඕනෙ. යම් කෙනෙක් කියනව නම් මාර්කට් එක ඉඩ මදියි කියල අපිට මාලු තොග වෙළඳ පොල තිබුන කොටසත් අරගන්න පුලුවන්. අපිට මෙතනට පොල ගෙනල්ල ස්ථාපනය කරන්න බලය තියෙනවා. සමුපකාරයට පුලුවන් ඔයිට වඩා සංවර්ධනාත්මක දෙයක් යෝජනා කරන්න. මගේ කතාවෙදි කාටහරි හිත් රිදවීමක් වුනානම් සමාවෙන්න. මම කිව්වෙ කරන්න ඕන දේයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බි. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මේ පුංචි පොල සම්බන්ධව අපි හැම සභාවකම වගේ කතා කරල තියෙනවා. සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට අපේ මාර්කට් එක අවුරුදු ගානක් වහල තියල අපි ඒකට මොකක්ද කරන්නෙ කියල කිසිම නිගමනයක් නැහැ. අපිට මෙතන යම් දෙයක් කිරීමට ඉඩ පහසුකම් තියෙද්දි අපි මේ ගැන තැකීමක් නොකර ඉන්න තත්වයක් තමයි තියෙන්නෙ. තමුන්නාන්සේලාගේ රජයක් තියෙන මේ අවස්ථාවේදි මේ සඳහා පෙළ ගැහෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නෙ. අපි විපක්ෂයේ හිටියත් කවද හරි අපි බලයට එන දවසකට මේක ප්‍රශ්නයක් වෙනවා. තමුන්නාන්සේලාට මේ ප්‍රශ්නය විසඳන්න වුවමනාවක් තියෙනවනම් ඒක කරන්න පුලුවන්. නගර සභා පනත අනුව කොටින්ම වෙනත් කෙනෙකුට පොලක් පවත්වගෙන යන්නත් බලයක් නැහැ. සමුපකාරය තමන්ගෙ කටයුතු දියුණු කරගන්න යම් ව්‍යාපාරයක් පවත්වගෙන යන එකට අපිට අවහිර කරන්න බැහැ. අපේ නගර සභාවෙන් එතුමන්ලා කරන කාර්යට අවසර දීල තියෙනවා. ඒ අවසර දෙන අවස්ථාවෙ සභාවට යොමු කරල කරා නම් ඒක වටිනවා. සභාපතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලය තමයි සැළසුම් කමිටුවේ ඉන්නෙ. මේ කටයුතු කරන කොට සුහදව කිරීම තමයි වැදගත් වෙන්නෙ. අපේ මාර්කට් එක එන්න එන්නම දුර්වල තත්වයට පත්වෙන එක තමයි වෙන්නෙ. අද වෙනකොට ෆුඩ් සිටි දෙකක් වැටිල තියෙනව අම්බලන්ගොඩ නගරෙ. ඒවගේම සුමනදාස ෆුඩ් සිටිය තියෙනවා. සෙනසුරාද ඉරිදට අද වෙනකොට බඩුවක් ගන්න බැරි තත්වයකට පත් වෙලා තියෙනව ඒතරම් සෙනග නිසා. අද  අමුතු රටාවකට තමයි වෙළඳාම යන්නෙ. මිනිස්සු කැමතියි ඒ ක්‍රමයට. එවැනි මට්ටමකට ඒ ස්ථානය සංවර්ධනය කරන්න අපිට පුලුවන් වෙන්න ඕනෙ. අපිට තමයි මම හිතන්නෙ අනිත් හැමටම වඩා මෙවැනි දෙයක් ඇති කරන්න ශක්තියක් තියෙන්නෙ. එම නිසා ඔබතුමාගෙ අවධානය මාර්කට් එකට යොමු වෙන්න කියල මම නැවත වතාවක් ඉල්ලා සිටිනවා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි මේ සම්බන්ධව සාකච්ඡා කරමු. මගේ මතය නම් මාර්කට් එක අදට ගැලපෙන ආකාරයෙන් සකස් විය යුතුයි. මේ තියෙන ගොඩනැගිල්ල කඩල පාර්කින් දාල සුනාමියක් ආවත් මුහුණ දෙන්න පුලුවන් විදියට සකස් වෙන්න ඕනෙ. ඒකට අපි ඉස්සරහට යමු. මේ තියෙන පුංචි පොල සම්බන්ධව අපි සාකච්ඡාවකට යමු.

- **පුංචි පොළ සම්බන්ධයෙන් තිරණයක් ගැනීම සඳහා මන්ත්‍රීවරුන් සියලු දෙනාත් සමුපකාර සමිතියේ සභාපතිතුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයත් කැඳවා සාකච්ඡා කිරීමට සභාව තීරණය කරන ලදී.**

- **පෙ. ව. 07.30 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමණියගේ මහතා සභාවට පැමණෙන ලදී.**

**6: 3** **2014- 05- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද වෙළද සංගම් කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළද සංගමය ඒකාබද්ධව පවත්වනු</u>

<u>ලබන ක්‍රීේයාකාරි කමිටු වා</u>ර්තාව

දිනය : 2014.05.21

ස්ථානය : නගර සභාව, අම්බලන්ගොඩ.

වේලාව : ප:ව 2.30

සහභාගිත්වය : එම්. ඩබ්. අරුණ ප්‍ර දිප් මයා - සභාපති
කමල් වැල්ලගේ මයා - උප සභාපති
භාරත සමරසේකර මයා - ලේකම්
එ. ඩබ්. ජගත් කුමාර මයා - නගර සභා මන්ත්‍රීය
ජේ. ඩබ්. ජයන්ත මයා - නගර සභා මන්ත්‍රීත
සමන් අත්තනායක මයා - වෙළද සංගමය, අම්බලන්ගොඩ
ඩබ්.එම්.ඉන්ද්‍රනන්ද ද සිල්වා මයා- වෙළද සංගමය, අම්බලන්ගොඩ
ජේ. එච්. වජිර සිල්වා මයා - වෙළද සංගමය, අම්බලන්ගොඩ
එන්. ඒ. රූපසිංහ මයා - මුලස්ථාන පොලිස් පරික්ෂක, අම්බලන්ගොඩ
කේ. ජී. ජී. ප්‍රිමයදර්ශන මයා - රථවාහන පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ
සුමිත් පරාක්‍රමමවංශ මයා - විදුහල්පතී, ධර්මාශෝක විදුහල, අම්බලන්ගොඩ
පි. යු. සුසන්ත ද සිල්වා මයා - විදුහල්පතී, කුලරත්න විදුහල, අම්බලන්ගොඩ
කේ. එ. ජේ. කුමාරි මිය - විදුහල්පතී, දේවානන්ද විදුහල, අම්බලන්ගොඩ
පි. එම්. ටි. විමලධර්ම මිය - සංවර්ධන නිලධාරි
ධම්මිකා මල්කාන්ති මිය - සංවර්ධන නිලධාරි

01. පිළිගැනීම :

- පොලිසිය, වෙළඳ සංගම් සාමාජිකයින් හා විදුහල්පතිවරු ඇතුළු සියලුම නිලධාරින් වෙළඳ සංගමය සඳහා සාධරයෙන් පිළිගන්නවා. **- සභාපති**

- මීට පෙර පොලීසිය විසින් ලබා දී තිබෙන රථවාහන සැලැස්ම පිළිබඳව නිතර නිතර වෙනස් කරන ලෙස ඉල්ලීම් කරන නමුත් නීතියක් එසේ විටින් විට වෙනස් කළ නොහැකි බවත් පොලීසිය විසින් ලබා දුන් මෙම රථවාහන සැලැස්මට අනුව පාසල් රථ වාහන ගමන් කල යුතු මාර්ගය වන්නේ ධර්මාශෝක විදුහලේ සිට පැමිණ වටරවුම ලගින් හරවා දේවානන්ද විදුහලට පැමිණ එතනින් සෙලාන් බැංකුව අසලින් ප්‍රජාපති විදුහලටත් පසුව කුලරත්න විදුහලටත් ගමන් කිරීමය, මෙම නිතිය පැනවීමට ප්‍රථම සියලුම පාසල්වල විදුල්පතිවරු කැඳවා මේ පිළිබඳව දැනුවත් කරන ලදී. ඒසඳහා දේවානන්ද විදුහලේ නියෝජනයක් නොවූ අතර, පසුව දේවානන්ද විදුහල එවන ලද ලිපිය මාසික සභාවට යොමු කළෙමි. ඒ අනුව වෙළඳ සංගමය සමඟ සාකච්ඡාකර තිරණය ගැනීමට යොමු කළ අතර මේ සම්බන්ධයෙන් තිබෙන ගැටළු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි. -

**සභාපති**

- පාසලේ ප්‍රධාන ගේට්ටුව පාරට විවෘත වන බවත්, පාර දෙපස වාහන නතර කිරිම නිසා දරුවන් පාරේ ගමන් කිරීමේදි අනතුරක් සිදුවිමේ ප්‍ර වනතාවය වැඩි වන බැවින් පාසල අවට වාහන ගමන් කිරිම හා නතර කිරිම නවත්වා ගැනිමට කටයුතු කල යුතු බවට පාසල් සංවර්ධන කමිටුවේදී තිරණයක් ගන්නා ලදි.

**- විදුහල්පති, දේවානන්ද විදුහල**

- පාසල් ආරම්භය හා අවසාන් කරන වේලාවන් වලදි විනාඩි 45කට ආසන්න වේලාවක් පාසල් අවටින් ගමන් කළ නොහැකි බවත් මෙම තත්වය පාසල අවට සිටින නිවැසියන්ට මහත් කරදරයක් බවත් බඳු ගෙන ජනතාවට සහනය සැලසිමට නගර සභාව කටයුතු කළ යුතුය. මෙම තත්වයට විසඳුමක් ලෙස දේවානන්ද විදුහල පැමිණෙන සිසුන් කනත්ත හන්දියේ බස්සන ලෙසත් ප්‍රජාපති විදුහලට පැමිණෙන සිසුන් හල්වතුර හන්දියේ බස්සන ලෙසත් යෝජනා කරමි.

**- ජේ. ඩබ්. ජයන්ත මයා**

- දේවානන්ද විදුහල ඉදිරියේ පොලිස් නිලධාරියකු යොදවා ඇති බවත් ඔහුගේ සේවය ප්‍රලමාණවත් නොවේනම් තවත් නිලධාරියකු පත් කර හැකිය. මාර්ගය සම්පූර්නයෙන්ම වැසිම ගැටළුවක් වන අතර දෙමාපියන් මෙන්ම පාසල් වාහන රියදුරන්ද දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව සැළකිලිමත් වන නිසා දරුවන්ව වහනයෙන් පාසල අසලටම ගෙනවිත් බස්සන බැවින් දරුවන් මගින් බස්සවද්දි නිවැරදිව පාසලට නොපැමිණිවිට මීට වඩා ගැටළු රැසකට මුහුණ දිමට සිදුවිය හැකිය. විශේෂයෙන් පොඩි ළමුන් දෙමාපියන් විසින්ම රැගෙන එන නිසා වාහන ප්‍ර මාණය වැඩිවිමට හේතුවන බවත් අප විසින් ලබාදුන් රථවාහන සැලැස්මට අනුව පාසල් රථ වාහන ගමන් නොකරන නිසා මෙම රථවාහන තදබදය උත්ගතවි ඇති බැවින් මෙම රථවාහන සැලැස්ම පිළිබඳව නැවතත් වාහන රියදුරන් දැනුවත් කිරිමට හැකියාවක් ඇත්නම් යහපත්ය.

**- මුලස්ථාන පොලිස් පරික්ෂක**

- අම්බන්ගොඩ නගරයේ පාරවල් වසා තැබිම අවම මට්ටමක පවත්වාගෙන යන්නේ නම් යහපත් බැවින් ධර්මාශෝක විදුහල අසලින් තිබෙන සංඝරාජ මාවත පොල්වත්ත පැත්තේ සිට එන පුද්ගලයන්ට විවෘත කරන ලෙසත් ඒසේ නොවුවිට එම පාරෙන් ගමන් කරන ජනතාවට ඉතා විශාල දුරක් ගමන් කිරිමට සිදුවේ. **- සභාපති**

- රෝසෙත් හන්දියේ වික්ර මසූරිය පාර වසන විට පොළ ළග පාර විවෘත කරන්නේ නම් ජනතාවට පහසුවක් සලසා ගත හැකිවේ. මෙම පොළ ළග පාර වන්වේ කරන්නේ යම් වේලාවක් තුලදි වුවත් මුලු දවසේම වන්වේ කර ඇති ආකාරයට එහි කටයුතු කරගෙන යන බව දැකගත හැකිය. අනවසර ත්රී රෝද රථ ගාලක් සතොස ළග පවත්වාගෙන යන බැවින් ඊට අමතරව පරණ පාර දිගටම හා මාර්කට් හන්දිය ළගත් අවසර දි තිබෙන ත්රීනරෝද රථ වලට අමතරව තවත් විශාල ත්රීමරෝද රථ ප්රළමාණයක් නවතා ඇති බැවින් මෙම තත්වය තුල ජනතාවට අපහසුතා රැසකට ලක්වන නිසා මේ පිළිබදව සොයන ලෙස ඉල්ලා සිටිමි.

**- උප සභාපති**

- මේ පිළිබදව අදම සොයා බැලිමක් සිදු කර හැකි අතර සමහර ත්රී-රෝද රථ පාරිභෝගිකයන් පැමිණි එවා වුවිට ඉවත් කිරිම අපහසු තත්වයක පවති. පොළ ළග පාර වන්වේ කර ඇති නමුත් එම වන්වේ කර ඇති වේලාවන් සඳහන් කර තිබේන පුවරුව ඉවත් කර තිබුණ හෙයින් නැවතත් එම වේලාවන් යොදා පුවරුවක් සකස් කර සවි කිරිමට කටයුතු කරමි.

  **- මූලස්ථාන පොලිස් පරික්ෂක**

- නීති විරෝධි කඩල කරත්තය සම්බන්ධයෙන් ලිපියක් එවා තිබුණි. මෙම කඩල කරත්ත හවස 6.00 න් පසු ආරම්භ කරන අතර මෙයින් කඩ හිමියන්ට යම් පාඩුවක් සිදුවනවා සේම යම් සේවයක්ද සිදුවේ එහිදී කඩයකින් මිළදී ගන්නවාට වඩා බෝහොම අඩු ගාණකට ආහාරපාන ආදීය මිනිස්සුන්ට ලබා ගත හැකියාවක් ඇති බැවින් ජනතාවට යම් සේවාවක්ද මෙමගින් සිදුවන අතර මෙම කඩලකරත්තය තහනම් කිරිම කොයිතාක් දුරට සාධාරන වන්නේද යන්න ගැටලුවක් මතුවේ. **- සභාපති**

- වෙනත් කරුණු - උත්තල දර්පණ සවිකිරිම සම්බන්ධයෙන් සමන් අත්තනායක මහතාට ස්තුතිවන්ත වෙමි. අම්බලන්ගොඩ නගර ආරක්ෂාව පිණිස CCTV කමරා සවි කිරිම වැදගත් වේ. බස්නැවතුම්පොළේ CCTV කමරා සවි කිරිමෙ හැකියාවක් අපසතුව ඇති නමුත් එම කැමරාවේ සටහන්වන දර්ශන පිළිබද නිරික්ෂනය කිරිම සඳහා පොලිස් නිලධාරි මහතකුගේ සහය අවශ්ය වේ. **- සභාපති**

- කඩවල CCTV කමරා සවිකර ඇති විට එක් කැමරාවක් පාරට යොමු කිරිම වැදගත් වන අතර මෙය සම්පත් පාමසි හා A.S.B. සාප්පුවේ දැකගත හැක වන අතර වෙනත් කඩසාප්පු වල කැමරා සවි කරන්නේ නම් එමගින් පාරේ දර්ශන ලබා ගත හැකිවන පරිදි සකස් කළ හැකිනම් යහපත්ය.

  - **සමන් අත්තනායක මයා**

02. රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම :

- ස්තුති කතාව කිරිම හා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරිම. **- ලේකම්**

සකස් කළේ : පි. එම්. ටි. විමලධර්ම (සංවර්ධන නිලධාරි)

**ඒ අනුව 2014 -05- 21 දින පවත්වන ලද වෙළද සංගම් කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

**6: 4** **2014- 05- 26** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභා</u>

<u>කළමණාකරන කමිටු රැස්වීම</u>

දිනය : 2014.05.26

ස්ථානය : නගර සභාව, අම්බලන්ගොඩ.

වේලාව : ප:ව 2.30

සහභාගිත්වය : එම්. ඩබ්. අරුණ ප්‍රvදීප් මයා - සභාපති

භාරත සමරසේකර මයා - ලේකම්

ඩී. ඩබ්. පත්මසිරි මයා - ගණකාධිකාරි

නිර්මලා ද සිල්වා මිය - ප්‍රමධාන කළ: සහකාර ආදායම්

කේ. සි. සි. ප්‍රණනාන්දු මිය - අභ්‍යතන්තර විගණන නිලධාරි

පි. එස්. එස්. ද සිල්වා මයා - මහජන සෞඛය පරික්ෂක

පි. සි. සජීවනි මිය - කර්මාන්ත අධිකාරි

එම්. මලික් ප්‍ර නාන්දු - තාක්ෂනික නිලධාරි

ජී. ජී. ඉල්ෂා මිය - ආදායම් පරික්ෂක

පි. එම්. ටි. විමලධර්ම - සංවර්ධන නිලධාරි

03. පිළිගැනීම :

- සියලුම නිලධාරින් කළමණාකරන කමිටුව වෙත සාධරයෙන් පිළිගන්නවා.

**- ලේකම්**

- **ගිණුම් අංශය පිළිබද සාකච්ඡා කිරිම**

- ආදායම් වියදම් පැකේජය වර්තමාන තත්වය, අනාගත තත්වය හා ඇතිවි තිබෙන ගැටළු පිළිබදව සාකච්ඡා කිරිම සඳහා වයඹ සංවර්ධන අධිකාරියේ නිලධාරින්ට පැමිණෙන ලෙස ලිපියක් මගිනි දැනුම් දුන් අතර ඔහුන් ජුනි මස 06 වන දින පැමිණෙන බව දැනුම් දී තිබේ. මෙහිදි ආදායම් අංශයේ හා වියදම් අංශයේ සියලුම නිලධාරින් හා වෙනත් අංශ නියෝජනය වන පරිදි එක් නිලධාරියකු වශයෙන් සහභාගි විය යුතු වේ.

\- **ගණකාධිකාරි**

## ➢ ආදායම් අංශය පිළිබඳ සාකච්ජා කිරිම

- ආදායම් අංශයේ නිලධාරින්ට අමතරව ආයතනයේ අනෙකුත් නිලධාරින්ගේ සහය ගෙන හිග වරිපනම් එකතු කිරිම සිදු කළ අතර එහිදී

| | | |
|---|---|---|
| හිග වරිපනම් | - 8 | 8464.87 |
| හිග කඩකුලි | - | 86455.32 |
| වෙළඳ බල පත්‍ර | | - 44103.00 |

මුළු එකතුව - 219023.19 වැනි මුදලක් එකතු කිරිමට හැකි විය.

ඉදිරියටත් මේ ආකාරයට මුදල් එකතුකර හිග වරිපනම් බලාගැනිමට කටයුතු කිරිමට බලාපොරොත්තු වෙනවා **- ප්‍රවධාන කළ: සහකාර ආදායම්**

- වරිපනම් එකතු කිරිමට යාමෙදි කඩ හිමියන් විසින් ඔවුන් අත්විධින ගැටළු රාශියක් ඉදිරිපත් කරනවා එනම් බස්නැවතුම්පලේහි වැසිකිලි භාවිතා කිරිමට නොහැකි බව, කාණු පද්ධතිය පිරිසිදු නොකරන බව ආදිය. ඔහුන් මෙසේ චෝදනා කර මුදල් ලබා දිමට අදිමදි කිරිමක් සිදුකරනවා. මෙම තත්වය තුලදී ආදායම් එකතු කිරිමට යාම අපහසු බවත් කඩිනමින් කඩහිමියන්ගේ ප්‍රසශ්න සඳහා විසදුම් ලබා දෙන්නෙ නම් අපේ රාජකාරිය පහසුවේන් ඉටු කර හැකිවේ. **- ආදායම් පරික්ෂක**

- ජල සම්පාදන මණ්ඩලේ වරිපනම් වල හිගයක් තිබෙන බවත් ඔවුන්ට ඒ බව දැනුම් දුන් විට වරිපනම් ගෙවා ඇති බවත් ප්‍රරකාශකරන නමුත් ධීරක්කන්ද මාවතේ පිහිටි වතුර ටැංකිය සඳහා රු63912.53 ක හිග වරිපනම් මුදලක් ලැබිමට ඇත. **- ආදායම් පරික්ෂක**

## ➢ කර්මාන්ත අංශය පිළිබඳ සාකච්ජා කිරිම

- වාහන වලට අවශ්‍යස උපකරන කිහිපයක් ලබා ගැනිමට තිබෙන බවත් ආදාහනාගාරය සිටින නිලධාරින් තිදෙනා අතර කිසිදු සහයොගිතාවයක් නොමැති බැවින් ප්‍රබශ්න ඇතිව තිබේ. එම නිසා මෙම නිලධාරින් තිදෙනා ගෙන්වා අවවාද කරන ලෙස ඉල්ලා සිටිමි.

  **- කර්මාන්ත අධිකාරි**

- ආදාහනාගාරයේ ගෙට්ටුව පිළිසකර කළ යුතුයි. කර්මාන්ත අංශයේ සිටි වඩු බාස් මහතාගේ කාර්යන් නොමැති බැවින් ඔහුගේ සේවය නතර කරන ලදි.

  **- තාක්ෂනික නිලධාරි**

## ➢ සෞඛ්‍ය ය අංශය පිළිබඳ සාකච්ජා කිරිම.

- ටෙලර් දෙකම කැඩි ඇති බැවින් එය සකස් කිරිමට අවශ්‍ය ය බවත් බස්නැවතුම්පොළේහි පිරිමි වැසිකිලියේ පිරිසිදු කිරිමට සිදුවි ඇති බව පවසන ලදි.

  - **මහජන සෞඛ්‍ය පරික්ෂක**

- සෞඛය අංශය සඳහා ලක්ෂ 1 ½ මුදලක් මාරුකර ඇති බවත් එම අංශයට අවශ්‍ය කටයුතු සිදුකර ගෙනයාමට හැකි බව පවසන ලදි. ආදාහනාගාර භූමිය තුළ කැළේ වැවිලා අපිරිසිදුවෙලා එවැනි පොදු තැන් පිරිසිදුව තබාගැනිම අපගේ වගකිමක් එම නිසා නිලධාරින් උනන්දුවෙලා සේවක මහතුන් යොදාගෙන මෙම කාර්යන් ඉටු කිරිමට වගබලාගන්න. **- සභාපති**

04. රැස්විමේ වැඩ කටයුතු අවසන් කිරිම :

- ස්තුති කතාව කිරීම හා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.

සකස් කළේ : පි. එම්. ටි. විමලධර්ම (සංවර්ධන නිලධාරි)

**ඒ අනුව 2014 -05- 26 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** **2014- 05- 29** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රිlඩා කමිටු රැස්වී</u>ම

දිනය - 2014.05.29
වේලාව - ප.ව. 2.30
ස්ථානය - නගර සභා රැස්වීම් ශාලාව

**සහභාගිත්වය**

ආර්. පී. දේව් රොහාන් මහතා - ගරු නගර සභා මන්ත්රි , අම්බලන්ගොඩ නගර සභාව.
භාරත සමරසේකර මහතා - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.
එගොඩගේ ජයසේන මහතා - ආචාර්ය , ශ්රීො දේවානන්ද විද්යා ලය
එම්.ඩබ්ලිව්. තරිඳු ප්රහාත් මහතා - ආචාර්ය, ගා/පී.ද.එස්.කුලරත්න විද්යාඃලය
සුගත් හෙට්ටිආරච්චි - ක්රීතඩා කමිටු සාමාජික
මහේන්ද්රට වික්ර මසිංහ මහතා - ක්රීාඩා කමිටු සාමාජික
එම්.ඩබ්ලිව්.ෂර්ලි චන්ද්රහසිරි මහතා - ක්රීටඩා කමිටු සාමාජික
ජී. අසෝක කුමාර මහතා - ක්රීරඩා භූමි උපදේශක, අම්බලන්ගොඩ නගර සභාව.
ඉඳුනිල් එදිරිවික්රෝමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු, අම්බලන්ගොඩ නගර සභාව.
කේ.එස්. එගොඩගේ මහතා -
ඩී.වී.තරංගි මිය - ප්රාජා සංවර්ධන නිලධාරි, අම්බලන්ගොඩ නගර සභාව

**පිළිගැනීම - ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් මහතා**

අද දින ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි පාසල් ආචාර්ය මහත්ම මහත්මීන්, ක්‍රී.ඩා සමාජ නියෝජනය කරමින් පැමිණි මහත්ම මහත්මීන් ක්‍රීඩා කමිටු සමාජික මහත්වරුන් සහ නගර සභා කාර්ය මණ්ඩලය ගෞරවයෙන් පිළිගනිමින් ගරු සභාපතිතුමා අත්‍යාවශ්‍ය රාජකාරි කටයුත්තක් සඳහා බැහැරව ගොස් ඇති බැවින් එතුමා පැමිණෙන තුරු කමිටු පවත්වාගෙන යන බව දන්වන ලදි.

ඒ අනුව න්‍යායපත්‍රානුකූලව ප්‍රථමයෙන් 2014 වර්ෂයේ පැවැත්වීමට නියමිත නගර ක්‍රීඩා තරග පිළිබඳ සාකච්ඡා කරන ලදි. (පැවැත්වීමට යෝජිත තරග හා ඇස්තමේන්තුව මේ සමග ඉදිරිපත් කරමි.)

**ගරු නගර සභා මන්ත්‍රීප ආර්.පී.දේව් රොහාන් මහතා**

තරගාවලිය සඳහා කුමන පාසල් සම්බන්ධකරගන්නේද යන්න විමසන ලදි.

**ප්‍රජා සංවර්ධන නිලධාරි ඩී.වී.තරංගි මිය**

ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ගාල්ල දිස්ත්‍රික්කයේ සියළුම පාසල් සම්බන්ධ කරගැනීමට කටයුතු කරන බව.

**එගොඩගේ ජයසේන මහතා**

2014 වර්ෂයේ පැවැත්වීමට යෝජිත යොවුන් ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරාගැනීම මේ දවස්වල සිදුකරන බැවින් ක්‍රීඩාවේ පිබිදීමක් සිදුව ඇති මෙම කාලයේ නගර ක්‍රීඩා උළෙල පැවැත්වීමෙන් ජාතික වශයෙන්ද විශාල සේවාවක් ඉටුවන බව හා මෙම තරගාවලිය ගාල්ල දිස්ත්‍රික්කයේ සියළුම පාසල් සඳහා විවෘත කිරීමෙන් පහසුකම් අඩු පාසල්වල දක්ෂ දරු දැරියන්ටද ඉදිරියට යාමට විශාල පිටුවහලක් වන බව.

**එම්.අයි.එම්. වික්‍රමසිංහ මහතා/ෂර්ලි චන්ද්‍රසිරි මහතා**

ජූලි මාසයේ දෙවන සතිය වන විට පාසල් අර්ධ වාර්ෂික පරීක්ෂණ පැවැත්වීමට නියමිත බැවින් හා අගෝස්තු මාසයේ උසස්පෙළ විභාගය ආරම්භ වන බැවින් ජුනි මාසයේ දෙවන සතිය වන විට ක්‍රීඩා තරග ආරම්භ කර ජූලි මාසයේ අවසන් කිරීම සුදුසු බව.

**එගොඩගේ ජයසේන මහතා**

ජයග්‍රාහක ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ලබා දෙන ත්‍යාග සහ සහතික පත් පිළිබඳ විමසන ලදි.

**ප්‍රජා සංවර්ධන නිලධාරි**

ශූරතාවය සඳහා රන් පදක්කම් සහ සහතිකපත්ද අනු ශූරතාවය සඳහා රිදී පදක්කම් සහ සහතිකපත්ද තෙවන ස්ථානය සඳහා ලෝකඩ පදක්කම් සහ සහතික පත්ද පිරිනමන බව.

**එගොඩගේ ජයසේන මහතා**

සහතිකපත් ලබා දීම ඉතා වටින අතර ඒ සමගම කුඩා හෝ ත්‍යාගයක් ලබා දීමට හැකි නම් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉතා කැමති බව. මේ සඳහා අනුග්‍රාහක ආයතනයක් සම්බන්ධකර ගැනීමට උත්සහ කරමු.ඒ වගේම මෙම ක්‍රීඩා උළෙලේ ක්‍රීඩා තරග සම්බන්ධීකරණ නිලධාරි මහත්ම මහත්මීන්ද අගයමින් ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානෝත්සවයේදීම සමරු තිළිණයක් ලබා දීමට හැකි නම් එය වටින බව.

**ෂර්ලි චන්ද්‍රරසිරි මහතා/ තරිඳු ප්‍රිභාත් මහතා**

මළල ක්‍රී◌ිඩා යටතේ සහය දිවීමේ තරගාවලියක් පැවැත්වීම සුදුසු බව යෝජනා කරන ලදි.

<u>**අදහස් හා යෝජනා**</u>

**එම්.අයි.එම්. වික්‍රකමසිංහ මහතා**
සැනකෙළි සඳහා ක්‍රී◌ිඩාභූමිය ලබා දීමේදී අයකරනු ලබන රු. 10,000.00 මුදල ඉතාමත් මදි බවත් එය අවම වශයෙන් රු.30,000.00 දක්වා ද ඇප මුදල රු.150,000.00 වැඩි කිරීම සුදුසු බව. මේ තුළින් ක්‍රීයඩා භූමියට වන හානිය අවම කරගත හැකිබව. එමෙන්ම ඉදි කිරිම් සිදු කරන විට මං තීරු වල ඉදිකිරීමට ඉඩ නොදෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**එගොඩගේ ජයසේන මහතා**

සෑම ක්‍රියකට් වාරයකදීම පාසල් වහලට ඇති වන හානිය වළක්වා ගැනීම සඳහා පිළියමක් යොදන ලෙස දිනපතාම උළු කැට මාරු කිරීමට සිදුවන අතර වර්ෂා කාලයේදී පන්ති කාමර තෙමෙන බවත්, ක්‍රි කට් තරග පැවැත්වෙන වේලාවන් හිදි පන්ති කාමර වල සිටින දරුවන්ට අනතුරු විය හැකි නිසා නිතර අවධානයෙන් සිටිමට සිදුවන බැවින් අධ්‍යාතපන කටයුතු වලටද බාධාවක් සිදුවන බව පෙන්වා දෙන ලදි.

එය වළක්වා ගැනීම සඳහා අඩි 30 පමණ උසට තාප්පයක් හෝ දැල් ආවරණයක් ඉදිකර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

කුලරත්න පාරේ පිහිටි ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රී ඩාංගණය මීදූලේ දිනපතාම රොසෙත් රෝහලට වෛද්‍යි ප්‍රරතිකාර සඳහා පැමිණෙන රෝගීන්ගේ පෞද්ගලික වාහන නතර කර තිබෙන බැවින් ක්‍රී ඩාංගණයට ඇතුළු වීමට නොහැකි වන බව හා ඇතැම් විට වාහන රියදුරන් සමග ගැටුම් ඇති කර ගැනීමට සිදුවන බව පෙන්වා දෙන ලදි .

මෙය නගර සභාවට අයත් දේපළක් නිසා මෙය වළක්වා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවළක් යොදාදෙන ලෙස හෝ නතර කරතිබෙන වාහන වලින් ගාස්තුවක් අයකර ගැනිමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

**ගරු නගර සභා මන්ත්‍රී◌ි ආර්.පී.දේව් රොහාන් මහතා**

මෙම ක්‍රීසඩාංගණය මාසයකට රු.1000.00 වැනි සුළු මුදලකට අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමටයට බදු දී ඇති බව හා මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කිරීමට කටයුතු සිදුකරන බව.

**එගොඩගේ ජයසේන මහතා**

බැඩ්මින්ටසන් සංගමයද පුහුණු වීම් සඳහා පැමිණෙන පාසලකින් අයකරනු ලබන්නේ මාසිකව රු.400.00 සුළු මුදලක් බවත් මේ මුදලින් ජල හා විදුලි බිල්පත් ගෙවීමටත් සේවකයකු සඳහා වැටුප් ගෙවීමටත් සිදුවන බව පෙන්වා දෙන ලදි. රාත්‍රි◌ිකාලයේ මෙම භූමියේ මත්පැන් පානය කරන බවත් හිස් බෝතල් එම භූමියේම තැනින් තැන දමායන බවත් මේ නිසා ගේට්ටුවක් හෝ සවිකර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**එම්.අයි.එම්. වික්‍රසමසිංහ මහතා**

ක්‍රීදඩාංගණය සඳහා විදුලි ආලෝකය ලබා ගැනීමට සාකච්ඡා කළද එය මෙතෙක් ඉටු නොවූ බව.කොළඹ නගර සභාවෙන් විදුලිය ලබා ගැනීම සඳහා කණු 10 ඉල්ලු නමුත් එය ක්‍රි යාත්මක කිරිමට අපහසුවක් ඇති බව දැනගැනීමට ලැබුණු බව දන්වන ලදි. ඒ අනුව ක්‍රී◌ාඩාංගණයට ස්ථිර විදුලිය සැපයීම සඳහා අඩි 30 ක් උස කණු 8 සහ අඟල් 3 ගැල්වනයිස් පයිප්ප ත්‍රිඅකෝණාකාරව වෙල්ඩින් කර ලාම්පුව සවිකරන ලැල්ල ෆයිබර් කිරිම යෝග්‍යල බව පෙන්වා දෙනලදි.

**ගරු නගර සභා මන්ත්‍රීන ආර්.පී.දේව් රොහාන් මහතා**

මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කිරීමට කටයුතු කරන බව.

**ස්තූති කථාව - ලේකම්, භාරත සමරසේකර මහතා**

අද දින තම වටිනා කාලය හා ශ්‍රමමය කැප කරමින් කමිටුව සඳහා පැමිණි සියළුම මහත්ම මහත්මීන්ට ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් තම අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් ස්තූතිය පළකරමින් කමිටුවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ-
ඩී.වී.තරංගි (ප්‍රජා සංවර්ධන නිලධාරි)

<u>සභාවේ අවධානයට යොමු වූ කරුණු</u>

1. සැනකෙළිය සඳහා ක්‍රීඩා භූමිය ලබා දීමේදී අයකරනු ලබන ගාස්තුව රු.30,000.00 දක්වාද ඇප ගාස්තුව 150,000.00 වැඩි කිරිම
2. ක්‍රි,කට් තරග පැවැත්වීමේ දි දේවානන්ද විද්‍යාලයේ ගොඩ නැගිලි වලට වන හානිය වළක්වා ගැනීමට පිළියම් යෙදීම
3. කුලරත්න පාරේ පිහිටි ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණ භූමියේ වාහන නතර කිරීම වැළැක්වීමට පියවර ගැනීම.
4. මහජන ක්‍රීඩාංගණයට විදුලි ආලෝකය ලබා ගැනීම පිළිබඳ.

<u>නගර ක්‍රීඩා උළෙල - 2014</u>

<u>පැවැත්වීමට යෝජිත තරග</u>

1. **ක්‍රිකට් වයස අවු. 15 න් පහළ බාලක**
2. **පා පන්දු වයස අවු. 15 න් පහළ බාලක**
3. **පැසි පන්දු වයස අවු. 15 න් පහළ බාලක**
4. **දැල් පන්දු වයස අවු. 15 න් පහළ බාලිකා**
5. **බැඩ්මින්ටන් වයස අවු. 19 න් පහළ (අවු. 13ට වැඩි අවු.19 ට අඩු ) බාලක/බාලිකා**
6. **මේස පන්දු වයස අවු. 15 න් පහළ/ 19 න් පහළ බාලක /බාලිකා**
7. **චෙස් වයස අවු. 15 න් පහළ/ 17 න් පහළ බාලක/ බාලිකා**
8. **සහය දිවීම වයස අවු.14 න් පහළ/ 16 න් පහළ බාලක/ බාලිකා**
9. **පිහිණුම් වයස අවු.15 න් පහළ/17 න් පහළ/ 19න් පහළ බාලක/ බාලිකා**

**ඒ අනුව 2014 -05- 29 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු රැස්වීම් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.**

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙහි අවධානය යොමු කල යුතු කරුණු 4 ක් තියෙනව. ඒ අය යෝජනා කරල තියෙනව සැණකෙළියක් සඳහා ක්‍රීඩා පිට්ය ලබා ගැනීමේදී අය කල යුතු ගාස්තුව රු. 30000 දක්වාද ඇප මුදල රු. 150000 දක්වාද වැඩි කරන්න කියල යෝජනා කරල තියෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපි ක්‍රීඩා පිට්යට දිනකට අය කරන මුදල අඩු බවයි සාකච්ජා වුනේ.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැනට අපි තමයි වැඩිම මුදලක් අය කරන්නෙ අනිත් සභාත් එක්ක බලනකොට. පිටින් ඇවිල්ල සැණකෙලි පවත්වන්නෙ නැහැ. නගරයේ තියෙන පාසල් තමයි සැණකෙළි පවත්වන්නෙ.

- **ක්‍රීඩා පිට්ය සඳහා ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් ඉදිරි වර්ෂයේ අය වැය සකස් කිරීමේදී සාකච්ජා කිරීමට සභාව තීරණය කරන ලදී.**

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

තවත් කරුණක් තියෙනවා ක්‍රිකට් තරග පැවැත්වීමේදී දේවානන්ද විද්‍යාලයට වන හානිය වලක්වා ගැනීම කියල.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි තරග තියෙන වෙලාවට බෝලෙ පාසල ඇතුලට යනව කියනවා. සමහර වෙලාවට ළමයි එළියට බස්සන්නෙ නැතුව ඉන්නවලු. යෝජනා කරේ පුලුවන්නම් තාප්පෙ උස් කරන්න.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මම ඔතනට යම් පිළියමක් කරන්න හදද්දි ඒ විද්‍යාලයෙන්ම ඒකට විරුද්ධ වුනා. ඔය දිගේ වලවල් පවා හැරුව නමුත් එම විද්‍යාලයෙන්ම විරුද්ධ වුනා. ඒ දවස්වල හිටෙවුව නම් අද වෙනකොට වහල මට්ටමට ඇවිල්ල. යම් අලංකාරයකුත් එනව. නමුත් විදුහල්පතිතුමා වළවල් වහන්න කියල උපදෙස් දුන්නා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

අඩි 30 ක 40 ක තාප්පයක් ගහන එක ප්‍රායෝගික නැහැ. ඒක ඇත්තටම අවධානම්.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අනික් කරුණ කුලරත්න පාරේ ඇති බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ මිදුලේ වාහන නැවැත්වීම සම්බන්ධව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

මෙහිදී ඔවුන් ඉල්ලා සිට්ය සභාපතිතුමනි සිවිලිම සහ ඇතුලත අලුත්වැඩියා කටයුතු කරන්න කියලා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වාහන ඇතුලට දාන එක එළියෙ නවත්වනවට වඩා හොඳයිනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මෙහිදී ඔවුන් ඉල්ලා සිටින්නෙ නගර සභාවට 60% ක මුදලක් දෙන්න වාහන වලින් මුදලක් අය කරන්න අවසර දෙන්න කියලා.

- **බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ අලුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමට සභාව තීරණය කරන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ක්‍රීඩා පිටියේ ලයිට් සවි කිරීමට මට කලින් සිසිර මහත්මය දීළ තිබුන කරන්න බැරි ඇස්තමේන්තුවක්. මට කරන්න පුලුවන් ඇස්තමේනතුවක් දෙන්න. මමත් පාපන්දු ක්‍රීඩකයෙක්. පාපන්දු ගහන අයට ක්‍රිකට් ගහන අයත් එක්ක ක්‍රීඩා කරන්න විදියක් නැහැ. ඒ නිසා ඒ අය කියන්නෙ රෑ 8 විතර වෙනකම් සෙල්ලම් කරන්න පොඩි ලයිට් ටිකක් දාල දෙන්න කියලා. ඒක සාධාරණයි. අනිත් එක මිනිස්සුන්ට ව්‍යායාම කරන්න වුනත් හොඳයි ඒ වෙලාව.

- **ක්‍රීඩා පිටියට විදුලි බල්බ සවි කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමට සභාව තීරණය කරන ලදී.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** **<u>ටෙන්ඩර් හා මිළගණන්</u>** :-

**7:1:1** **<u>ටෙන්ඩර්</u>** :- **නැත**

**7:2** **<u>මිල ගණන්</u>** :- **නැත**

## (08) ගෙවීම්

8.1 ඇ. අංක 1015 යටතේ ලබා ගත් ද්‍රව්‍ය සඳහා අම්බලන්ගොඩ, වි. සේ. ස. සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 112130/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

.

| | | | |
|---|---|---|---|
| DS 40 Engine Oil | 355/- X 210 L | - | 74550.00 |
| HP 90 Gear Oil | 3090/- X 12 L | - | 37080.00 |
| Barall | 500/- X 1 | - | <u>500.00</u> |
| | | | <u>112130.00</u> |

8. 2 ඇ. අංක 1017 යටතේ ලබා ගත් 37.5 kg GAS සිලින්ඩර 8 සඳහා අම්බලන්ගොඩ, මිළිඳු එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 7218/-X 8)

8.3 ඇ. අංක 1027 යටතේ ලබා ගත් 37.5 kg GAS සිලින්ඩර 8 සඳහා අම්බලන්ගොඩ, මිළිඳු එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 7218/-X 8)

8.4 ඇ. අංක 1028 යටතේ ලබා ගත් LED බල්බ් සෙට් 40 ක් සඳහා අම්බලන්ගොඩ, චානක එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 10000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 250/-X 40)

8.5 ඇ. අංක 1016 යටතේ ලබා ගත් තාර සඳහා මුතුරාජවෙල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 149040.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (රු. 16560/-X 9)

8.6 ඇ. අංක 1021 යටතේ ලබා ගත් භාණ්ඩ සඳහා බලපිටිය රාජපක්ෂ ස්ටෝර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12900.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

පා පැදි 01 (හීරෝ වර්ගයේ) 129000.00 X 1 = 12900.00

8.7 2014 සිගිති අවුරුදු උළෙල වෙනුවෙන් ලබා ගත් භාණ්ඩ සඳහා අම්බලන්ගොඩ, උපේන්ද්‍ර එගොඩගේ මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 13500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

| | | |
|---|---|---|
| බෆල් ෆෝන් සහ එෆ් එම් මයික් | - | 9000/- |
| ටෙන්ට් 10 ක් | - | 4500/- |
| | | 13500 /- |

8. 8 නගර සභාව සතු 49 - 9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 20311.60 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4653 | ඩීසල් | 46 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4670 | ඩීසල් | 43 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4679 | ඩීසල් | 44 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4690 | ඩීසල් | 23 |
| | එන්ජින් ඔයිල් | 01 |

8. 9 නගර සභාව සතු 49 - 9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15613.60 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4657 | ඩීසල් | 25 |
| 4669 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4681 | ඩීසල් | 39 |
| 4692 | ඩීසල් | 22 |

8. 10 නගර සභාව සතු RA - 3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15960.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4655 | ඩීසල් | 38 |
| 4672 | ඩීසල් | 32 |
| 4682 | ඩීසල් | 36 |
| | එන්ජින් ඔයිල් | 03 |
| 4689 | ඩීසල් | 17 |

8. 11 නගර සභාව සතු RA - 8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15539.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | | ප්‍රමාණය ලීටර් |
|---|---|---|---|
| 4654 | ඩීසල් | | 39 |
| 4673 | ඩීසල් | | 40 |
| | බැටරි වතුර | බෝතල් | 02 |
| 4688 | ඩීසල් | | 48 |

8. 12 නගර සභාව සතු 49 - 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17051.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4651 | පවර් ස්ටියරින් ඔයිල් | 02 |
| 4656 | ඩීසල් | 29 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4671 | ඩීසල් | 37 |
| | බැටරි වතුර බෝතල් | 01 |
| 4680 | ඩීසල් | 34 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4691 | ඩීසල් | 19 |
| | එන්ජින් ඔයිල් | 01 |

8\. 13 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ් රථය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 30082.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4659 | ඩීසල් | 35 |
| 4661 | ඩීසල් | 44 |
| 4676 | ඩීසල් | 47 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4685 | ඩීසල් | 55 |
| 4696 | ඩීසල් | 58 |
| | එන්ජින් ඔයිල් | 01 |

8.14 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16954.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4622 | ඩීසල් | 70 |
| 4697 | ඩීසල් | 70 |

8.15 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසර රථය සඳහා 2014 අප්‍රේල් මස 01-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 16992.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4687 | ඩීසල් | 139 |
| | බැටරි වතුර බෝතල් | 02 |

8:16 2014 පෙබරවාරි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 39790.03 |
| 23453 I | 1907.01 |
| 34453 I | 3523.63 |
| 52453 I | 34594.51 |
| 53454 | 16058.85 |
| 62453 I | 27164.15 |
| | 123038.18 |

විදුලි බිල්පත් සඳහා රු. **123038.18** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදි

8:17 2014 පෙබරවාරි මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52453 II | 27981.60 |
| 62453 II | 22564.04 |
| 34453 II | 852.32 |
| 23453 II | 23256.92 |
| 11453 II | 10610.88 |
| | **85265.76** |

ජල බිල්පත් සඳහා රු: **85265.76** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදි

8:18 2014 මාර්තු මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| වැය අංකය | සැප්තැම්බර් |
|---|---|
| 11452 | 19063.84 |
| 12452 | 1211.73 |
| 25451 II | 2195.25 |
| 62452 I | 5045.65 |
| | **27516.47** |

දුරකතන බිල්පත සඳහා රු **27516.47** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදී

8:19 ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු නගර සභා මන්ත්‍රීවරුන්ගේ 2014 මාර්තු මාසය සඳහා ගමන් වියදම් දීමනාව වෙනුවෙන් රු. 18000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

8:20 නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා 2014 අප්‍රේල් මාසයට සපයන ලද පුවත්පත් වෙන්වෙන් රු. 36660.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී

8:21 ශ්‍රී දේවානන්ද විද්‍යාලය විසින් නගර සභා ක්‍රීඩා පිටිය වෙන් කර ගැනීම සඳහා ගෙවන ලද මුදලින් රු. 1000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි නැවත දේවානන්ද විද්‍යාලය වෙත ගෙවීම සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මෙවැනි අවස්ථා සම්බන්ධයෙන් මින් පෙර ලබා ගෙන ඇති සභා තීරණය අනුව කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.

## **(09** ගිණුම්

**9:1** 2014 අප්‍රේල් මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2014 අප්‍රේල් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## **(10)** ඇස්තමේන්තු

10:1 පටබැඳිමුල්ල ළමා උද්‍යානය ඉදිකිරීමේ අතිරේක වැඩ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 344539.35 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2) විහාරගොඩ පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 1515924.70 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3) කසළ අවසාන බැහැරලන ස්ථානය සංවර්ධනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 302110.05 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට සභාව තීරණය කරන ලදී.**

10:4) ගාලු පාරේ මහජන ක්‍රීඩාංගණය අසල ඇති රථවාහන නැවතුම තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 623932.30 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) කෙරම්ණිය පොල්අතුකන්ද ඇළ අසල පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 133123.21 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:6) පින්නදුව වටරවුම් පාරේ පැතිබැම්ම ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 435303.99 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:7) පොකුණ පාරේ දෙවන හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 95590.28 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:8) කෙරමිණිය පතිරාජ පාරේ පැතිබැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 305674.60 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:9) පොකුණ පාරේ කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 355101.40 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **පෙ. ව. 11.15 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභාවෙන් නික්ම යන ලදී.**

10:10) නගර ක්‍රීඩා 2014 වෙනුවෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් සකස් කරන ලද රු. 450000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දිය යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (11) වෙනත් කරුණු

**11:1** **‘** මීටියාගොඩ ගා/ ශ්‍රී පුෂ්පාරාම මහා පිරිවෙන් ස්වර්ණ ජයන්ති මහොත්සවයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම **’** මැයෙන් මීටියාගොඩ ගා/ ශ්‍රී පුෂ්පාරාම මහා පිරිවෙනේ පරිවේනාධිපති හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

මීටියාගොඩ ගා/ ශ්‍රී පුෂ්පාරාම මහා පිරිවෙණෙහි 50 වෙනි සැමරුම 2014 ජුනි මස 22 වෙනි දිනට යෙදී ඇති බවත් ඒ වෙනුවෙන් ‘ පින් කෙතක අසිරිය ’ නමින් ස්වර්ණ ජයන්ති සැමරුම් කලා මංගල්‍යයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් ඊට අදාල බැනරයක් අම්බලන්ගොඩ නගරයේ සවි කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

__තීරණය__

☛ **' පින් කෙතක අසිරිය ' ස්වර්ණ ජයන්ති සැමරුම් කලා මංගලපයට අදාල බැනරයක් අම්බලන්ගොඩ නගරයේ සවි කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:2** ' රණවිරු රියල් ස්ටාර් තරගාවලියේ කටවුට් එකක් ප්‍රදර්ශනය කිරීම ' මැයෙන් රණවිරු රියල් ස්ටාර් තරගාවලියේ තරග වදින නාවික හමුදාවේ වෛද්‍ය සහායක සුමේන්ද්‍ර රිෂී බටුවංගල මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

රණවිරු රියල් ස්ටාර් තරගාවලියේ අවසන් දහසය දෙනා අතර තරග වදින නාවික හමුදාවේ වෛද්‍ය සහායක සුමේන්ද්‍ර රිෂී බටුවංගල මහතාගේ එස්. එම්. එස්. අංකය ප්‍රදර්ශනය වන 5'' 3 ප්‍රමාණයේ කටවුට් එකක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් තිබුණි.

__තීරණය__

☛ **රණවිරු රියල් ස්ටාර් තරගාවලියේ තරග වදින නාවික හමුදාවේ වෛද්‍ය සහායක සුමේන්ද්‍ර රිෂී බටුවංගල මහතාගේ එස්. එම්. එස්. අංකය ප්‍රදර්ශනය වන 5'' 3 ප්‍රමාණයේ කටවුට් එකක් අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:3** ' දැන්වීම් පුවරුවක් සම්බන්ධ ඉල්ලීමක් කිරීමටයි ' මැයෙන් අම්බලන්ගොඩ ඉඩම්තොට කේ. එල්. ද සිල්වා මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

යුධ හමුදා සංඥා බලකායේ සංඥා සෙබලෙකු වශයෙන් සේවය කරන කේ. එල්. ද සිල්වා මහතා රණවිරු රියල් ස්ටාර් තරගාවලියේ පළමු 14 දෙනා අතරට සුදුසුකම් ලබා ඇති බවත් එම තරගාවලියේ තමාගේ එස්. එම්. එස්. අංකය ප්‍රදර්ශනය කිරීම සඳහා අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ඉදිරිපිට සවිකර ඇති දැන්වීම් පුවරුව එම තරගය අවසන් වන තෙක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

__තීරණය__

☛ **රණවිරු රියල් ස්ටාර් තරගාවලියේ තරග වදින සංඥා සෙබල කේ. එල්. ද සිල්වා මහතාගේ එස්. එම්. එස්. අංකය ප්‍රදර්ශනය වන දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ බස් නැවතුම්පොල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:4** ' දැන්වීමක් සවි කිරීම සඳහා අවසර ලබා ගැනීම ' මැයෙන් බලපිටිය සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප පාසලේ ආරම්භ කර ඇති තාක්ෂණවේදය විෂය ජනප්‍රිය කිරීමේ අධ්‍යාපනික දැන්වීමක් අම්බලන්ගොඩ නගරයේ නොමිලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☞ **සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනික දැන්වීමක් මුදල් අය කිරීමකින් තොරව අම්බලන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**11:5** ' නගර සභා ශාලාව සහ පුටු නොමිලේ ලබාගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ, නින්දාන, පී. සරත් පද්මලාල් මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

බලපිටිය අධිකරණ කලාපයේ සාම විනිසුරුවරුන් සඳහා නොමිලේ පුහුණු වැඩමුලුවක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා 2014 ජුනි මස 22 වන ඉරිදා දින පෙ. ව. 8.00 සිට ප. ව. 2.00 දක්වා නගර සභා ශාලාව සහ පුටු 300 ක් නොමිලේ ලබා දීමට කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **පුහුණු වැඩමුලුවක් පැවැත්වීම සඳහා 2014 ජුනි මස 22 වන ඉරිදා දින පෙ. ව. 8.00 සිට ප. ව. 2.00 දක්වා නගර සභා ශාලාව සහ පුටු 300 ක් නොමිලේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අද දින අසනීප තත්වයේ පසුවන බැවින් මාසික සභාවට සහභාගි විය නොහැකි බව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය දුරකතනයෙන් මා වෙත දැනුම් දෙනු ලැබුවා.

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' පුටු 100 ක් හා කොඩි කණු 10 ක් ලබා ගැනීම ' මැයෙන් කේ. ඩබ්. රංජිත් ප්‍රේම ජයන්ත මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 - 05 - 16 දින අම්බලන්ගොඩ දුම්රිය පොල අසල පැවැත්වෙන බත් දන්සැල සඳහා පුටු 100 ක් හා කොඩි කණු 10 ක් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

තීරණය

☞ **අම්බලන්ගොඩ දුම්රිය පොල අසල පැවැත්වෙන බත් දන්සැල සඳහා පුටු 100 ක් හා කොඩි කණු 10 ක් නොමිලේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසරය ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' කොඩි කණු 10 ක් ලබා ගැනීම සඳහා ' මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 විජයග්‍රාහී සම්මාන පෙලපාලිය සඳහා අවශ්‍ය කොඩි කණු 10 ක් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **2014 විජයග්‍රාහී සම්මාන පෙලපාලිය සඳහා කොඩි කණු 10 ක් නොමිලේ ලබා දීමට සහා අනුමැතියට යටත්ව අවසරය ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** **‘** අම්බලන්ගොඩ නගර සභා පවිත්‍රතා අංශයේ සේවක අවුරුදු උපහාරය - 2014 **’** මැයෙන් අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල, ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ දායක සභාවේ ගරු ලේකම් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

විහාරාධිපති මහාචාර්ය විලේගොඩ අරියදේව හිමියන් විසින් වාර්ෂිකව පවත්වාගෙන යනු ලබන නගර සභාවේ සේවක මණ්ඩලයේ මහත්ම මහත්මීන්ට අවුරුදු තෑගි ප්‍රදානය කිරීමේ උත්සවය මෙවරද පැවැත්වූ බවත් එදින මෙම උත්සවය සාර්ථක කර ගැනීම සඳහා නියමිත වේලාවට පැමිණ උත්සවයේ සියලු කටයුතු වලට සහභාගී වෙමින් දැක්වූ අනුග්‍රහයට ස්තූතිය පුද කර සිටින බවත් දන්වා තිබුණි.

**තීරණය**

☞ **මෙම ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:4** **‘** සුහද ක්‍රිකට් තරගයක් පැවැත්වීම සඳහා **’** මැයෙන් නගර සභාවේ පණිවුඩකරු එම්. නලින් චන්ද්‍රජිත් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා ක්‍රිකට් කණ්ඩායම සහ පොල්වත්ත දිසා රෝහල් ක්‍රිකට් කණ්ඩායම අතර සුහද ක්‍රිකට් තරගයක් 2014- 06- 08 වන දින නගර සභා ක්‍රීඩා පිටියේදී පැවැත්වීමට සංවිධානය කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා වන රු. 5000/- ක ඇස්තමේන්තුව සහ අදාල මුදල ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **සුහද ක්‍රිකට් තරගය සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති රු. 5000/- ක ඇස්තමේන්තුව සහ අදාල මුදල ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** **‘** චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය පැවරීම **’** මැයෙන් නගර සභාවේ ලේකම්තුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

නගර සභා අරමුදලින් කරනු ලබන ගෙවීම් සඳහා චෙක්පත් හා අණකර අත්සන් කිරීමේදී දෙවන අත්සන ලේකම්තුමා විසින් සිදු කරනු ලබන අතර ලේකම්තුමා නිවාඩු දිනවලදී රාජකාරී කටයුතු සිදුකර ගැනීම සඳහා දෙවන අත්සන්කරු වෙනුවට එස්. ඩී. රාමනායක මහත්මිය කටයුතු කල බවත් එම මහත්මිය ස්ථාන මාරු ලබා ඇති බැවින් ඒ වෙනුවට රාජකාරී කටයුතු කරන එස්. නිර්මලා පියරංසි ද සිල්වා මහත්මියට ලේකම්තුමා නිවාඩු දිනවලදී චෙක්පත් හා අණකර අත්සන් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **එස්. නිර්මලා පියරංසි ද සිල්වා මහත්මියට ලේකම් තුමා නිවාඩු දිනවලදී චෙක්පත් හා අණකර අත්සන් කිරීම සඳහා බලය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.6 “ 2014- 05- 06 දින සභාවේ සාකච්ජා වූ කරුණු සම්බන්ධවයි ” මැයෙන් තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

බස් නැවතුම්පොල පිටුපස පෙදෙසෙහි බල්බ සියල්ල මේ වන විට අලුතින් යොදා ඇති බවත් බස් නැවතුම් පොල පින්තාරුව සම්බන්ධ වාර්තාවක් ලබා දී ඇති අතර අදාල ආයතනය දැනුවත් කර ඇති බවත් බුද්ධදත්ත මාවත පිහිටි නගර සභාව සතු කාණුව අවහිර වනසේ ඇති කිතුල් ගස කපා ඉවත් කිරීමේ නිවේදන යැවීම සඳහා නිර්දේශ ලබා දුන් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

12.7 “ නිවාඩු ලබා ගැනීම සඳහා ” මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 ජුනි මස 07, 08, 09, සහ 10 යන දිනයන්හිදී තමා විදේශ සංචාරයකට සහභාගි වීමට නියමිත බවත් ඒ සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙම සංචාරය සඳහා උප සභාපතිතුමාද සහභාගි වන බැවින් එම කාලය තුල සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා ගරු නගර සභා මනිත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා මෙනවිය මා යෝජනා කරනවා. එය කවුරු හරි ස්ථිර කරන්න. සම්ප්‍රදාය වෙන්නෙ ඊළගට ඉන්න කෙනාට බලය පැවරීමයි.

සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මන්ත්‍රීතුමා සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මෙතනදි පාලක පක්ෂයේ ප්‍රශ්නයකට අපිත් අපහසුතාවයට පත් වෙනවා. මෙතන නම් දෙකක් යෝජනා වෙලා තියෙනවා අපිට මධ්‍යස්ථ භාවයක් අනුගමනය කරන්න වෙනවා.

**තීරණය**

☞ **ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා හට විදේශ සංචාරය වෙනුවෙන් 2014 ජුනි මස 07, 08, 09, සහ 10 යන දිනයන් සඳහා නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාද මෙම සංචාරය සඳහා සහභාගී වන බැවින් නිවාඩු කාලයේදී වැඩ බැලීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.8 " නිවාඩු ලබා ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014 ජුනි මස 07, 08, 09, සහ 10 යන දිනයන්හිදී තමා විදේශ සංචාරයකට සහභාගි වීමට නියමිත බවත් ඒ සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☞ **ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා හට විදේශ සංචාරය වෙනුවෙන් 2014 ජුනි මස 07, 08, 09, සහ 10 යන දිනයන් සඳහා නිවාඩු අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 1, ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මාසයේ වැඩසටහන 1 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:10** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 2, ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මාසයේ වැඩසටහන 2 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

**තීරණය**

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:11** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 3, ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මාසයේ වැඩසටහන 3 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:12** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 5 ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මාසයේ වැඩසටහන 5 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:13** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 6 ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මාසයේ වැඩසටහන 6 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:14** ' 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වෙනත් ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මාසයේ පොදු ගිණුමට අදාල වෙනත් විෂයන්ගේ වැය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:15** ‘ 2014 - මාසික සභාවට ඉදිරිපත් කිරීම විවිධ ගිණුම් ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 අප්‍රේල් මස සේවක ණය, සේවක ප්‍රතිලාභ, පූජා, ක්‍රීඩා, නගර අලංකරණ හා ප්‍රාග්ධන ගිණුම් යටතේ දරණ ලද වියදම් ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

✪ වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි ආර්. පී. කාංචනා රුවන්ති මහත්මිය ලිපියක් ඉදිරිපත් කරල තියෙනව. ඇයට සිදුවුන අසාධාරණයක් සම්බන්ධවයි කියලා. ඇය විසින් නගර සභාවට භාරදී ඇති අනුබෙදුම අනුමත කරවා දෙන ලෙස තමයි ඇය විසින් ඉල්ලා තිබෙන්නෙ. සභාපතිතුමනි මේ සම්බන්ධව සාධාරණයක් කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒකට අපි නීත්‍යානුකුලව කටයුතු කරනවා. මේකෙ වරිපනම් ලේඛනයේ තියෙන නම වෙනස්. එයාම ඉදිරිපත් කරල තියෙනව බෙදුම් නඩුවක ප්ලෑන් එකක්. ඒක අනිවාර්යෙන්ම බෙදුම් නඩුවකින් බෙදා වෙන් කරපු කොටසක්. දිසා විනිසුරු මේ පැත්තට පෙන්නුවහම අපි ඒ පැත්තට ඒක හරවනව. ඒක කරන්න කියල තියෙන්නෙ. ඒක පළවෙනි කාරණය. දෙවනි කාරණය එයා අනුබෙදීමක් ඉදිරිපත් කරල තියෙනව පර්චස් 39.5 කට. නමුත් එයාට අයිති පර්චස් 20.5 යි. අපිට බෑ කාගෙවත් ඉඩමක් බෙදන්න. තමන්ගෙ ඉඩම බෙදතහැකි. ඔය කාරණා දෙක නිවැරදි වුනහම හරි. මේ ඉඩමෙ අනික් අය දිසා විනිසුරුගෙන් එහෙම දීල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එතුමියට මොකක් හරි සාධාරණයක් කරන්න බලන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මම උදව් කරන්න තමයි හිටියෙ. එතුමිය කියන්න කලින් තාප්පයක් බඳිනව. මම කිව්ව බඳිනඑක නවත්තන්න කියලා. එතුමිය ඒක දිගටම කරගෙන යනවා. අපිට ඇහුම්කන් දෙන්න එපැයි අපි එයාට උදව්වක් කරන්න. මට ගෙදරට ඇවිල්ල බැණ බැණ යනවා. මට පේනව මේකෙ නීත්‍යානුකුල පැත්තක් නැහැයි කියන එක.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමාට එහෙම කතා කරා නම් අපි ඒක හෙලා දකිනවා. නමුත් මේ තැනැත්තියගේ ප්‍රශ්නෙදි ඔතන තවත් කොටස්වල වරිපනම් හරවල තියෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව් ඒව නීත්‍යානුකූලව කරල තියෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මම ඉල්ලා සිටින්නෙ මේ තැනැත්තිය කවදු කියලවත් මම දන්නෙ නැහැ. මේ ලියුම මට අද උදේ ලැබුනෙ. මේ කරුණු අනුව අවුරුදු 45 ක පිඹුරුපත් ඉදිරිපත් කරයි කියල තියෙනවා. සමහර කොටස්වල වරිපනම් හරවලයි කියලත් තියෙනවා. ඒ නිසා සභාපතිතුමනි මේ ගැන පරීක්‍ෂා කර බලා මෙතුමියට සාධාරණයක් ඉටු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්‍ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි මම මීඨ පෙර කවදාවත් ඔබතුමාට මේ ගැන කියල නැහැ. මම තමයි ඉස්සෙල්ලම ඔතන ඉඩමක් ගත්තෙ. ඒකෙත් තිබ්බෙ ඔය මරතේනිස් සිල්වා කියන නම තමයි. මම සියලු අවසාන තීන්දු සේරම හදල තමයි මෙහේ රුපියල් හත්දාස් ගානක් ගෙවල අනුබෙදුම අරගෙන තමයි සභාපතිතුමා මම ඒ ගේ හැදුවෙ. ඔතන ඔය ඉඩමෙ තාප්පයක් බඳිනව කියල මම තමයි ඔබතුමාට කිව්වෙ කියල තියන්නෙ. මම ඇත්තටම ඔබතුමාට එහෙම දෙයක් කිව්වෙ නෑ. මම කැමතියි මනුස්සයෙක් ගෙයක් හදනවට. ඔය කියන ස්ථානය මම හොඳටම දන්න ස්ථානයක්. ඒකෙ ඉස්සෙල්ල හිටිය ඔය තැනැත්තියගෙම නැන්දගෙ පුතා. ඒ ඉන්න කොට ඒ තැනැත්තියලම පෙත්සමක් ගහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නඩුවක් දාල මම මේ නඩුවට පෙනී හිටිය නිසා මම බය නැතුව කියන්නෙ රජයේ දේපලක් කියල ප්‍රාදේශිය ලේකම්තුමා කිව්වහම මහේස්ත්‍රාත්තුමා කිව්ව මේක කෙටියෙන් අවසන් කරන්න නැත්තම් මේක මහාධිකරණය දක්වාම යනව කියලා. ඒපාර ඒළමය මට කිව්වහම මම කිව්ව වැරුද්ද පිළිගන්න කියල රු. 25000/- ක දඩයක් නියම කරා. ඒ දඩය ගෙවල ඉවත් වුනේ ඒ තැනැත්තියගෙ ඔය ආර්. පී. චන්ද්‍රානි කියන ඔතනම ඉන්න කෙනාගෙ පුතා. එතකොට පෙත්සම ගැහුවෙ ඔය කියන තැනැත්තිය. එතකොට සභාපතිතුමා එදා ඒ යම් පුද්ගලයෙකුට අයිති නැති තැන රජයේ දේපලක් නම් අද මේ තැනැත්තියට ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන්න බෑ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බෙදුම් නඩුවෙන් බෙදා වෙන් කරපු එහා පැත්තෙ කොටස නගර සභාව විසින් හල්වතුර ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගෙන තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්‍ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි වැරදි වැඩ කරල නැහැ. මේකෙ චෝදනාව මට ආපු නිසයි මම කතා කරේ. මෙම තැනැත්තියටත් කොටසක් ඇති මම නැහැ කියන්නෙ නෑ. නමුත් පෙළපතක් පෙන්නන්න බැහැ. ඒකයි තියෙන ප්‍රශ්නෙ. මගේ ඉඩමයි මේ ඉඩමයි දෙකම තියෙන්නෙ මර්තේනිස් සිංඤෝ නමින්. නමුත් සභාපතිතුමා අපේ එකට තියෙන බෙදුම් නඩුව නෙමෙයි මේකට තියෙන්නෙ. වෙනස් එකක්. මගේ ෆයිල් එක අරගෙන බලන්න මම අනුබදුමට ඒ සියල්ල දුන්නා. ඒ අනුව තමයි මගේ එහා පැත්තෙ ගෙවල් සියල්ල ඒ ක්‍රමය අනුගමනය කරපු නිසා තමයි ඔතෙන්ට ඇවිල්ල තියෙන්නෙ. ඔය කියන පර්චස් 39 ක් නම් නැහැ සභාපතිතුමා. දැන් ගිහිල්ල බලන්න දැන් 40 කට වැඩියි.  එතකොට ඒ රක්ෂිතයත් අල්ලල. දැන් තාප්පෙ බැඳල අවසන්. රටේ නීති දෙකක් තියෙන්නෙ බෑ කිසි කෙනෙකුට. දැන් ඊයෙ වෙනකොට ගොඩනැගිල්ල අත්තිවාරම් දාල ඉවරයි. එහෙමනම් මේ අම්බලන්ගොඩ කිසිම කෙනෙකුට මම මීට පස්සෙ කියනව ගිහිල්ල වෙල්වල ගෙවල් ගහන්න. නගර සභාවට කිසි නඩු දැමීමක් කරන්න බැහැ. අපි මෙතෙන්ට පත්වෙලා ඉන්නෙ ජනතාවගේ ඡන්දෙන්. අපි මෙතනින් යනකොට යන්නෙ හිස් අතින්. මම නීතියට පිටින් යමක් කරල නැහැ. මම මෙච්චර වෙලාවක් ගත්තෙත් අද ඒ ගැන කතා කරන්න ඕන නිසයි. එහෙම නම් සභාපතිතුමා මේ නගරයේ ඔබතුමා ප්‍රධාන පුරවැසියා විදියට අනිත් අයට දෙන නීතිය එතනත් ක්‍රියාත්මක

කල යුතුව තිබෙනවා. ඔහොම කරන්න ගියහම නගර සභාවට ආදායම නැතුව යනවනේ. ඒ නිසා සභාපතිතුමා තාප්පයක් ඉදි කරල තියෙනව ගෙයක් අත්තිවාරම් දාල තියෙනවා නීතිය ක්‍රියාත්මක කරන්න කියල මම දැඩිව ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙහේ අනුමත කරාට රට පටහැනිව ඉදිකරන ඒවත් තියෙනවා. ඒකෙ වගකීමත් අපේ සභාවට තියෙනවා සභාපතිතුමනි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම කරොත් පදිංචි වීමේ සහතිකය ගන්න කොට බලනවා. මන්ත්‍රීතුමා මේ වරිපනම් වෙනස් කිරීම අම්බලන්ගොඩ නගර සභාවෙ අභිමතය පරිදි විතරක් කරන්න බැහැ. ඒ සඳහා වෙනම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තියෙනවා. අපි කරන්නෙ මෙතනින් ලේඛන භාර අරගෙන නිර්දේශ කරල එහෙට යවනව. අපි වැරදි විදියට යැව්වොත් ඒගොල්ලො ආපහු එවනව. ඔය දැන් අසාධාරණ ලෙස කරයි කියනව නම් එහෙනම් තක්සේරු දෙපාර්තමේන්තුව එවනව වෙනස් කියල. අපි කරන දේ සර්ව සාධාරණව කරන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ දේ සාධාරණව කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මේ එකම ඉඩම D4 කෙටස ඇය ඉල්ලීම කරන්නෙ පර්චස් 20.5 ක කොටසට. අනිකුත් ඉඩම් කොටස් වලට දීපු ආකාරය සලකල මේ සම්බන්ධයෙන් සාධාරණයක් ඉෂ්ඨ කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනිවාර්යෙන් සාධාරණය ඉෂ්ඨ කරනවා.

**පෙ. ව. 11.50 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| භාරත සමරසේකර, | ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්, |
| ලේකම්, | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2014 – 06 – 19 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**